## 2022/02/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/02/08 දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 02. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2022.02.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. කොරෝනා වසංගත තත්ත්වය නැවතත් හිස ඔසවමින් පවතිනවා. සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව අපි කටයුතු කරමු. ඒ වගේම නාගොඩ බල ප්‍රදේශයේ මේ වන විටත් කොරෝනා මරණයක් සිදු වෙලා තියෙනවා. මේ කාල වකවානුව තුල අප බොහෝ ප්‍රවේසම් විය යුතුයි. අද දින දැණුම් දීම පරිදි ගරු සභාවට සහභාගි වන ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගනිමින්, සභාව ආරම්භ කරනවා. මන්ත්‍රීවරු කිහිප පලකගේ පැමිණීම ප්‍රමාද වන බවද දැණුම් දුන් බවද, ප්‍රකාශ කරනවා.

ඒ වගේම ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා සහ ගරු මන්ත්‍රී කේ.එච්.එම්. නදීකා දර්ශනී මහත්මිය සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති අතර එම මන්ත්‍රීතුමාට හා මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කරමි.

**(අ)01. 2021.12.14 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

2022.01.11 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. කපල්විල, පරණතානායම්ගොඩ, මාපලගම.ගල්කන්ද කොටසෙහි ජීවත්වන පිරිස මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා සිලින්ඩර ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද 2021.12.09 දිනැති ලිපිය සභා ගත කරන ලදී

02ක්‍රිකට් පුහුණුව සඳහා මාපලගම ක්‍රීඩා පිටිය ලබා ගැනීම සම්බන්ධයෙන් කිංස්ලි යූ ජාගොඩ මයා විසින් යොමු කරන ලද 2022.01.11 දිනැති ලිපිය සභාගත කරන ලදී

03. අයාලේ යන ගවයින් මාපලගම බස්නැවතුම්පොළේ ලැගුම් ගැනීම සම්බන්ධව දකුණු පළාත් මාර්ගස්ථ මාර්ග ප්‍රවාහන අධිකාරිය විසින් යොමු කරන ලද 2022.02.03 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන යෝජනා.**

01. තල්ගස්වල සති පොළේ හා උඩුගම සති පොළේ ඉදි කර ඇති දැනට අබලන්ව සහ භාවිතයට නොගන්නා කඩ කාමර කඩා ඉවත් කොට එහි ඇති සෙවෙලි තහඩු, යකඩ බට සහ අනිකුත් නැවත ප්‍රයෝජනය ගැනීමට හැකි සියළු දේ උඩුගම සභා උප කාර්යාලයට ගෙන ගොස් තැබීම (තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය ඇතුළු)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථීර කරන ලදී.**

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ප්‍රයෝජනයට ගත හැකි ද්‍රව්‍යවලින් අපට පුළුවන් පෙර පාසල්වලට පොඩි ස්ටේජ් එකක් හදන්න. මොකද දෙමව්පියන් එකතුවෙලා බොහොම අමාරුවෙන් තමයි. පෙර පාසල් වල උත්සව තියන්න ස්ටේජ් එක හදන්නෙ. ඊට අමතරව යම් කිසි මුදලක් අය කර ගෙන අපට වෙනත් අවස්ථාවලටත් එම ස්ටේජ් එක ලබා දෙන්න පුළුවන්. එය සභාවට ආදායම් මාර්ගයකුත් වේවි. මෙම ප්‍රයෝජනයට ගත හැකි ද්‍රව්‍යවලින් ස්ටේජ් එකක් නිර්මාණය කරන්න කියලා, ඉහත සඳහන් යෝජනාව සංශෝධිතව සම්මත කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එන්.වී. සමන් මහතා**

ගරු උප සභාපතිතුමා විසින් ස්ටේජ් එකක් නිර්මාණය කරන්න කියලා කරන ලද යෝජනාව මම ස්ථිර කරනු ලබනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,**

තව මුදලක් වියදම් කරලා හරි ඉහතින් සඳහන් කල ස්ටේජ් එකක් නිර්මාණය කිරීමේ කටයුත්ත කරන්න. පොදු කටයුතුවලට වගේම සභාවට ආදායම් මාර්ගයක්. ඒ වගේම මේ කර්තව්‍යය සිදු කරන විට පළමුවෙන්ම, අපේ තාක්ෂණ නිලධාරී මහත්වරුන් යොදා අධීක්ෂණය කරල, ගන්න පුළුවන් දේවල් සම්බන්ධව වාර්තාවක් ගන්න.

**ගරු උපසභාපතිතුමා විසින් කරන ලද සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. තල්ගස්වල සති පොළේ හා උඩුගම සති පොළේ ඉදි කර ඇති දැනට අබලන්ව සහ භාවිතයට නොගන්නා කඩ කාමර කඩා ඉවත් කොට එයින් ඉවත් කරන යකඩ බට සහ සෙවෙලි තහඩු යොදා තාක්ෂණ උපදෙස් ඇතුව උඩුගම ඇප්තොප්වත්තේ කොම්පෝස්ට් අංගනයට ගෙනෙන කසල ස්ථාන ගත කර ඇති ස්ථාන සෙවෙලි තහඩු යොදා එම ස්ථානය සංවර්ධනය කිරීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03.මාපලගම ඉදිකරන ලද ළමා ක්‍රීඩා පිටිය දෙපස සහා මාර්ගවලින් ඉවත් කරන ලද කැටගල් අල්ලා මිදුල සැකසීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථීර කරන ලදී.**

**ගරු චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,**
සභාපතිතුමනි, මේ සඳහා විශේෂිත කැටගල් වර්ගයක් වන රබර් කැටගල් තමයි මේකට සුදුසු වෙන්නෙ.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සඳහා නිවැරදි කිරීම් හා විරෝධතා නොමැතිනම් සභා සම්මත කරන්න.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථීර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. නාගොඩ නගරයේ තුඩැල්ල සිට අට්ටික්කාගහදූව පාළම දක්වා ප්‍රාදේශීය සභා මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථීර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. නාගොඩ පරන තැපැල් කාර්යාලය අසළ වසන්ත මයාගේ නිවස දක්වා මාර්ගය පස් දමා ගොඩ කිරීම (ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගයේ පස් වලින්)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථීර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. නාගොඩ ඉන්ධනහල පිටුපස නිවාසවලට යන මාර්ගය පස් දමා ගොඩ කිරීම (ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගයේ පස් වලින්)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථීර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ ලබා දුන් මාපලගම වෙළඳ සංකීර්ණයට යාබද මාපලගම මාර්ගයට මුහුණලා ඇති බිමෙහි ජංගම මත්ස්‍ය අලෙවිසැළ ස්ථානගත කිරීමට යෝජනා කිරීම.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථීර කරන ලදී.**

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,**

මත්ස්‍ය අලෙවිසැල සම්බන්ධයෙන් අදාළ පුද්ගලයාට සභාවෙන් පැවරුවේ කොහොමද? එහි තක්සේරුව ගත්තෙ ටෙන්ඩර් කමිටුවක් මගින්ද? මේ වන තුරු අපි මේ සම්බන්ධයෙන් දැනුවත් නැහැ. තවත් පුද්ගලයෙක් මේ අවස්ථාව ගන්න බලාපොරොත්තුවෙන් හිටියනම්, ඒ පුද්ගලයාට අසාධාරණයක් වෙනවා. කුමන නිර්ණායක පදනම් කරගෙනද මේ පුද්ගලයව තෝරගත්තෙ? රාජ්‍ය දෙපලක් දෙනවනම්, විනිවිධභාවයකින් යුතුව දෙන්න තිබුණා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ධීවර අමාත්‍යාංශය මගින්ම නිර්නායක එවලා තිබුණා. එම නිර්නායක අනුවම දෙන්න ගියානම්, ගැටළු ඇතිවෙනවා. මොකද අප බල ප්‍රදේශයේ පුද්ගලයකුම තෝරා ගත යුතුව තිබුනා. ඒ වගේම සියළුම සුදුසුකම් සපුරා ඇති පුද්ගලයකු සොයා ගැනීමේ අපහසුතාවය තිබුණා. මේ සම්බන්ධයෙන් පුද්ගලයන් දෙන්නෙක් ඉදිරිපත් වෙලා හිටියා . ඒ අතරින් මෙම පුද්ගලයාට 75% ක පමණ සුදුසුකම් තිබුණා. ඊට අමතරව එම අමාත්‍යාංශය මගින්ම කඩිනමින් එක් පුද්ගලයකු නම් කර එවන ලෙස අපෙන් ඉල්ලුම් කර තිබුණා. එම නිසා අපි මෙම පුද්ගලයාට මත්ස්‍ය වෙළඳසැල ලබා දෙන්න තීරණය කරළා, අදාල ආයතනවලට දැණුම් දී ඒ කටයුතු සිදු කළා.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

මෙම අලෙවිසැලේ බද්ද සඳහා මුදලක් නියම කළාද?

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

නැත. ලැල්ලේ වටිනාකම රු. 262078.66 ක් වෙනවා.ත එයින් 50% ක් වන රු. 131039.33 ක මුදලක් වසර 3 ක් හෝ 5 ක් තුල අප ප්‍රාදේශීය සභාවට ගිවිසුම්ගතව කොටස් වශයෙන් මෙම මුදල අය කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සඳහා නිවැරදි කිරීම් හා විරෝධතා නොමැතිනම් සභා සම්මත කරන්න.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. ගිංගඟ ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන සේ ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සහ පරිසර අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරන පරිසර වැඩසටහනෙන් ලබා දෙන ප්ලාස්ටික් බෝතල් සහ ප්ලාස්ටික් සම්බන්ධ ඉවත ලන ද්‍රව්‍ය එකතු කරන බඳුන් නාගොඩ, මාපලගම, තල්ගස්වල, උනන්විටිය, කැටගොඩ, උඩුගම, යටලමත්ත නගරාශ්‍රිතව ස්ථාන ගත කිරීමට අවසර ලබා දීම.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මන්ත්‍රී කොට්ඨාසවලින් ඉල්ලා ඇති මාර්ග ප්‍රමුඛතාවය මත සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

මෙම මාර්ග පවරා ගැනීම සඳහා ලබා දුන් ලිපිවල අඩුපාඩු තියෙනවා. මාර්ගවල දිග පළල යනාදිය, මාර්ගය අයත් ග්‍රාම නිලධාරී වසම, වැනි අඩුපාඩු සකස් කර ගෙන, ග්‍රාම නිලධාරීන් සමඟ සම්බන්ධ වෙලා, පවරාගැනීමේ කටයුතු සිදු කරමු. ඒ වගේම මුලින්ම තියෙන පාර ඒ ආකාරයෙන්ම පවරා ගෙන අවශ්‍ය නම් පසුව පුළුල් කර ගැනීමේ කටයුතු සිදු කරමු. ඒ වගේම මේ සම්බන්ධව ලබන මස න්‍යාය පත්‍රයට ඇතුලත් කරමු.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ඇත්තටම මෙම පවරා ගැනීමේ කටයුත්ත ලේසි පහසු කර්තව්‍යයක් නෙවෙයි. මෙය දීර්ඝ කාලයක් යන කටයුත්තක්. නමුත් කල යුතුයි. ලිඛිතව ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සඳහා නිවැරදි කිරීම් හා විරෝධතා නොමැතිනම් සභා සම්මත කරන්න.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. පළාත් පාලන කටයුතු භාර රාජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ළමා හා කාන්තාවන්ගේ ජීවිත සුරක්ෂිත කරමින්, විධිමත් වූ ආරක්ෂණ රැකවරණ ක්‍රමවේදයක් සැකසීම සඳහා ආරක්ෂණ කමිටුවක් පිහිටුවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 29 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2022.02.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2022 ජනවාරි මස මන්ත්‍රිවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ගෙවීම් - රු. 1300.00

iii. නාගොඩ ප්‍රාදේශීය සභාවේ රියදුරන් හා කාර්යාල කාර්යය සහායකයන් සඳහා 2022 වර්ෂය සඳහා නිල ඇඳුම් හා මැහුම් කුලී දීමනා ගෙවීම - රු.24000.00

**02. එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2022 ජනවාරි - රු. 10395.00

**03. නීතිඥ හේමන්ත පී.ඩබ්ලිව් විතාරණ මයා, ලේන්බාන් වීදිය, කොටුව**

i. SP 164 දරණ නඩුවට අදාළව 2022.01.05 දින නීතිඥ පෙනී සිටීමේ, පෙරකලාසි ගොනු කිරීමේ හා මුද්දර ගාස්තු - රු.10000.00
ii. L 36 නඩුවට අදාළව 2022.01.31 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 5000.00
iii. SP 138 දරණ නඩුවට අදාළව 2022.01.21 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 5000.00
iv. L 16242 නඩුවට අදාළව නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 3500.00

**04. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2022 ජනවාරි - රු. 6700.00

**05. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2022 ජනවාරි - රු. 7360.00

**06. A.J.G. ස්ටේෂනරි, කලුවැල්ල, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 5500.00

**07. ජී.පී.සඳුන් චතුරංග මයා, ර්බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම**

i. තාක්ෂණ අංශයේ පරිගණකයේ windows හා Autocad මෘදුකාංගය යෙදීමේ බිල්පත - රු. 1250.00

**08. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා පෙබරවාරි මස මාසික කුලීය ගෙවීම - රු. 6000.00

**09. යූ.වික්‍රමසේකර මයා, ලෝරන්ස් ෆැෂන්, උඩුගම**

ප්‍රාදේශීය සභා පෙර පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් මිළදී ගැනීමේ බිල්පත - රු.280000.00

**10. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**11. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2022 ජනවාරි) - රු.14500.00

**12. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කම්යුනිකේෂන්**

i. 2022 ජනවාරි මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු.28500.00
ii. 2022 ජනවාරි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1365.00

**13. කේ.එච්.එම්. කැළුම් චාමර මයා, නාගොඩ**

ජංගම මත්ස්‍යා වෙළඳ රථය රැගෙන ඒම සඳහා SPLL 7650 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත පියවීම - රු. 1550.00

**14. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**

i. වීරි පහන් බටවල තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය තීන්ත ආලේප කිරීමේ බිල්පත- රු. 2095.00

ii. ප්‍රධාන කාර්යාලයේ වතුර මෝටරය හා බට පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා ලබාගත් භාණ්ඩ සඳහා ගෙවීම - රු. 810.00

**15. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

සෞඛ්‍ය කම්කරුවන් සඳහා අත් මේස් ලබාදීමේ බිල්පත - රු. 7500.00

**16. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, මාපලගම**

LL 7650 දරණ කැ කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු.1600.00

**17. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

PF 7360 අංක දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම - රු.25995.00

**18. එම්.ජේ.ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2022.01.11 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 7150.00

**19. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**

i. කොවිඩ් 19 තෙවන මාත්‍රාව ලබාදීමට සහභාගී වූ නිලධාරීන්ගේ සංග්‍රහ වියදම් ගෙවීම (2022 ජනවාරි 11,12,13,14,15,16 සඳහා) - රු.15240.00

ii. පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුම්ඇසුරුම් කිරීමට පොලිතීන් බෑග් මිළදී ගැනීම - රු. 375.00

**20.එන්.ජී.ගීතා රංජනී මිය, මාපලගම මහජන පුස්තකාලය**

දසමස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා දීම -රු.250000.00

**<u>21.2022 ජනවාරි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියැලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 5000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 6300.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1056.00 |
| ර්.ආර්.බී.ගුණවර්ධන මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1000.00 |
| බී.ඩී.රුවිනි චතුරිකා මිය | - කළමනාකරණ සහකාර | - රු. 900.00 |
| ඒ.එස්.මසීදා මිය | - කළමනාකරණ සහකාර | - රු. 920.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1828.00 |
| කේ.එච්.එම්. කැළුම් චාමර මයා | - රියදුරු | - රු. 700.00 |

**<u>22.2022 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3000.00 |

**23. අතිකාල දීමනා ගෙවීම්**

**2021 දෙසැම්බර්**

ඒ.එච්.ජී. සංජීව මයා - වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු. 1695.00
(තල්ගස්වල පොළ මුර සේවය යෙදීම වෙනුවෙන්)

**2022 ජනවාරි මස**

එම්.ඒ.වසන්ත මයා - රියදුරු - රු. 9136.00

**පොදු අරමුදල්**

**24. කුරුපනාව ගොවි සංවිධානය , කුරුපනාව**

උඩුගම පුරනැගුම ගොඩනැගිල්ලේ වේදිකාවේ බිත්තිවල තීන්ත ආලේප කිරීම
කර්මාන්තයේ රැඳවුම් මුදල ගෙවීම - රු. 12075.74

**25. පී.වානක රංග මයා, වානක එන්ටර්ප්‍රයිසස්**

i. උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල ප්‍රධාන මාර්ගය පැති කාණු කපා සංවර්ධනය කිරීම
වෙනුවෙන් ගෙවීම - රු. 75000.00

ii. කැප්පිටියාගොඩ ග්‍රාම සේවා වසමේ අත්කම් නිවාස මාර්ගය සංවර්ධනය කිරීම - රු. 17500.00

**රජයේ ආධාර**

**පළාත් නිශ්චිත - 2020**

**26.ඌරල පහළ ගොවි සංවිධානය, ඌරල, වදුරඹ**

225 සී ඌරල ග්‍රාම නිලධාරී වසමට අයත් ඌරල පහළ අක්කර 25 මාර්ගය
ප්‍රතිසංස්කරණය කිරීම කර්මාන්තයට අදාළ රැඳවුම්මුදල් ගෙවීම - රු. 97326.03

**පළාත් නිශ්චිත - 2021**

**27.කුරුපනාව එකමුතු ජ්‍යෝෂ්ඨ පුරවැසි සංවිධානය**

මාපලගම නගරයේ ළමා උද්‍යානය ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව ගිවිසුම්ගත
කොන්ත්‍රාත්තුව වෙනුවෙන් සිදු කල වැඩ කොටස සඳහා ගෙවීම - රු.232689.96

**උපමාන පාදක -2019**

**28.කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය**

නාගොඩ වැලිගොඩවත්ත තොටුපල සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළ
රැඳවුම් මුදල් ගෙවීම - රු. 9794.68

**දකුණු පලාත් සංවර්ධන සැළැස්ම**

**29. යටලමත්ත ශ්‍රී සුමංගලාරාම ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය**

බරවාමුල්ල මයියොක්කාහේන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළ
මුදල් ගෙවීම - රු.443618.58

ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ) 2. 1. 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සාරාංශයක් ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම
    **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**පෙ.ව.11.00 ට ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා, ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා සහ ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා සභාවට පැමිණෙන ලදී.**

02. 2021.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සිදු කරන භාණ්ඩ සමීක්ෂණයෙන් ඉදිරිපත් කරන යෝජනා සම්මත වීමෙන් අනතුරුව තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ හා වෙන්දේසි කමිටුව සඳහා මන්ත්‍රීවරුගේ නම් ඉදිරිපත් කිරිමට යෝජනා කරමි.

මෙහිදී අපහරණ හා වෙන්දේසි කමිටුව සඳහා ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා, ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය, සුදුසු යැයි යෝජනා විය.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. සේරවත්ත, උඩලමත්ත, ගාල්ල යන ලිපිනයේ ඩයලොග් දුරකථන කුළුණක් ඉදි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

04. තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය 2021.12.09 දිනෙන් අවසන් වන බැවින්, කොන්ත්‍රාත් කරු වන එස්.එන්.ජේ.කේ. ආයතනය කරන ලද ඉල්ලීම අනුව දින 60 කට කාලය දීර්ඝ කරන ලදී. එම කාලය 2022.02.09 දිනෙන් අවසන් වන අතර, දැනට වෙළඳපොලේ සිමෙන්ති හිඟය නිසා ඉතිරි ඉදිකිරීම් කටයුතු කිරීමට අපහසු බවත්, තව මාස 03 කින් කාලය දීර්ඝ කරන ලෙසත්, මවෙතින් ඉල්ලුම් කර ඇති බැවින් එම කාලය දීර්ඝ කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ගයාන්මධුසංඛ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. 214 ඊ කැටගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් ඇල්ලවත්ත මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 214 බී කැටගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් සමෘද්ධි මාවත කොරි පස් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 214 අලුත් ඉහළ ග්‍රාම නිලධාරී වසමට අයත් දෙහිගොඩ වෙලේගෙදර මාර්ගයේ අබලන්ව ඇති ස්ථානය සඳහා බෝක්කු යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරනඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සහ වැට ඉදි කිරීම රු. 975000.00
02. උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල කොණ්ඩුගොඩකන්ද මාර්ගය සංවර්ධනය කිරීම රු. 50000.00
03. උක්ඕවිට පෙර පාසල් භූමියෙහි කාණු කැපීම, පස් ඉවත් කිරීම හා උඩුගම උප කාර්යාල භූමිය වගා කිරීම සඳහා බිම සැකසීම රු. 45500.00
04. උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවත ස්කවේටර් යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම රු. 3900.00
05. 214 ඒ මලාමුර ග්‍රාම නිලධාරී වසමට අයත් සෞඛ්‍ය කාර්යාලය අසළ සිංහගිරිය මාර්ගය සංවර්ධනය කිරීම රු. 78000.00
06. 214 අලුත් ඉහළ කොවුලානවත්ත මාර්ගයේ කාණු කපා සංවර්ධනය කිරීම රු. 15000.00

07. හෝමදොල ප්‍රධාන පාරේ ජන උදාන ගම්මානය මාර්ගයේ විල්පිට මයාගේ නිවස අසළ පැති බැම්ම ඉදිකිරීම රු. 1100000.00
08. අලවත්තවිල , හුංගමගෙදර , මාතර ගෙදර හරහා කුරුපනාව මරණාධාර සමිතිය මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම රු. 500000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු උප සභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**පෙ.ව.11.15 ට ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා, ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා සහ ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා සභාවට පැමිණෙන ලදී.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉවත්කරන CFL බල්බ සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | ඩී.එන්.පී. එකෝ රිසයිකල් සෙන්ටර් - වත්තහේන | එච්.යූ.එස්. රිසයිකලින් - පොරවගම | රත්න ඉලෙක්ට්‍රිකල්ස් - මත්තක |
|---|---|---|---|
| CFL බල්බ 01 මිලදී ගන්නා මිල | 1.75 | 1.50 | 1.60 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉවත්කරන CFL බල්බ සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා උපරිම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ඩී.එන්.පී. එකෝ රිසයිකල් සෙන්ටර් -වත්තහේන ආයතනයට නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉවත්කරන CFL බල්බ ලබා දීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාව කාර්යාල උපකරණ සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | චන්දන ලී බඩු නාගොඩ | බවන ෆර්නිචර් - මත්තක | දම්රෝ ඉන්ඩස්ට්‍රීස් - උඩුගම |
|---|---|---|---|
| කාර්යාල මේස 2X 4 | **18500.00 පියස්ට්‍රා** | **17000.00 පියස්ට්‍රා** | **25357.50** |
| කාර්යාල පුටු | **14500.00 පියස්ට්‍රා** | **13900.00 පියස්ට්‍රා** | **14287.50** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාල උපකරණ මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ බවන ෆර්නිචර් - මත්තක වෙතින් නාගොඩ ප්‍රාදේශීය

සභාවේ කාර්යාල උපකරණ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් සඳහා උපකරණ ලබාදීමට ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | ගමගේ එන්ටර්ප්‍රයිසස්-මාපලගම | බවන ෆර්නිචර් - මත්තක | දම්රො ඉන්ඩස්ට්‍රීස් - උඩුගම | සිතුමිණ එන්ටප්‍රයිසස් - මත්තක |
| --- | --- | --- | --- | --- |
| ළමා පුටු පලාස්ටික් | **750.00** | **780.00** | **657.00** | **790.00** |
| ටී.වී. ස්ටැන්ඩ් | **7000.00** | **7500.00** | **7067.50** | **9700.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් සඳහා උපකරණ ලබාදීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ළමා පුටු පලාස්ටික් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ දම්රො ඉන්ඩස්ට්‍රීස් - උඩුගම වෙතින් හා ටී.වී. ස්ටැන්ඩ් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ගමගේ එන්ටර්ප්‍රයිසස්- මාපලගම වෙතින්අදාළ උපකරණ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනි නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඩුප්ලෝ මුද්‍රණ කටයුතු සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය ඩුප්ලෝ මුද්‍රණය | ජේ.පී. කොමියුනිකේෂන් - නාගොඩ | ග්‍රාෆ් ටෙල් කොමියුනිකේෂන් - යටලමත්ත | යසස් කොම් - උනන්විටිය |
| --- | --- | --- | --- |
| ඒ 4 තනිපැත්ත | **3.50** | **3.75** | **4.00** |
| ඒ 4 දෙපැත්ත | **4.50** | **5.00** | **4.50** |
| ඒ 3 තනිපැත්ත | **5.00** | **5.50** | **5.50** |
| ඒ 3 දෙපැත්ත | **6.50** | **7.00** | **6.60** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඩුප්ලෝ මුද්‍රණ කටයුතු සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ජේ.පී. කොමියුනිකේෂන් - නාගොඩ වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඩුප්ලෝ මුද්‍රණ කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ජායා පිටපත් කිරීම සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය ඩුප්ලෝ මුද්‍රණය | ස්මාර්ට් කොමියුනිකේෂන් - | ග්‍රාෆ් ටෙල් කොමියුනිකේෂන් - | ජේ.පී. කොමියුනිකේෂන් - |
| --- | --- | --- | --- |

| | ඇතුමලේ | යටලමත්ත | නාගොඩ |
|---|---|---|---|
| ඒ 4 තනිපැත්ත | **6.50** | **5.50** | **6.50** |
| ඒ 4 දෙපැත්ත | **8.00** | **6.50** | **7.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ජායා පිටපත් කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ග්‍රාෆ් ටෙල් කොමියුනිකේෂන් - යටලමත්ත වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ජායා පිටපත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවන්ට අවශ්‍ය සබන් සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | සාරංග ෆුඩ් සිටි - මාපලගම | ගයාන් ෆුඩ් සිටි - යටලමත්ත | ලියනගේ ට්‍රේඩ් සෙන්ටර් - නාගොඩ |
|---|---|---|---|
| ඩෙටෝල් සබන් | 67.00 | 69.00 | 68.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවන්ට අවශ්‍ය සබන් මිළදී ගැනීමට ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ සාරංග ෆුඩ් සිටි - මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවන්ට අවශ්‍ය සබන් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් සඳහා උපකරණ ලබාදීමට ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | චන්දන ලී බඩු නාගොඩ | වික්‍රමසිංහ ලී මොල වලකුඹුර | බිම්සර ලී බඩු නාගොඩ |
|---|---|---|---|
| පොත් රාක්ක<br>දිග අඩි 4<br>පලල අඩි 4 | **9950.00** | **11200.00** | **10500.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් සඳහා උපකරණ ලබාදීමට ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ චන්දන ලී බඩු නාගොඩ වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙරපාසල් සඳහා උපකරණ ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා

විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවට ලිපිද්‍රව්‍ය හා උපකරණ සඳහා ලැබී ඇති මිල ගනන්**

| | ලිපි ද්‍රව්‍යයේ නම | ඒ.ජේ.ජී. ස්ටේෂනරි - ගාල්ල | දුලාරා ස්ටේෂනරි- ගාල්ල | රෙනුල ස්ටේෂනරි - ගාල්ල |
|---|---|---|---|---|
| | $A_4$ සුදු පාට ෆොටෝ කොපි පැකට්01 (ඇවලොන්) ගේජ් 80 | 1150.00 80ජ්ජ් | 1460.00 80 | 1550.00 80 G |
| 1. | $A_4$ විවිධ පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 | 815.00 | 815.00 rainbow | 920.00 rainbow |
| 2. | $A_4$ පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 | 1500.00 light co<br>1700.00 dark co | 1500.00 light co<br>1700.00 dark co | 1600.00 light co<br>1820.00 dark co |
| 3. | පෑන් | 17.50 atlas<br>12.50max<br>11.00 Speed | 12.70 atlas | 18.50 atlas |
| 4. | සයින් පෙන් | 57.00 mrico point | 58.00 | 60.00 mp |
| 5. | පර්මනන්ට් මාකර් පෙන් | 70.00 gxin | 78.00 gxin | 80.00 gxin |
| 6. | රෝනියෝ ශීට් | 525.00 | 530.00 | 575.00 |
| 7. | රාජකාරී ගමන් මලු (කාන්තා-පිරිමි) | 13750.00 | - | - |
| 8. | පාට ඩිමයි කොල | 10.00 | 10.00 | 15.00 |
| 9. | පොලිතින් අගල් 12 පීජී | 17.00 1m | 18.00 1m | 20.00 1m |
| 10. | වයිට්බෝඩ් පෙන් | 75.00 gxin | 77.00 | 80.00 gxin |
| 11. | ෆයිල් කවර සාමාන්‍ය (100) | 850.00 | 860.00 | 950.00 |
| 12. | CR පිටු 40 පොත් (ඇට්ලස් ) | 52.50 | 53.00 | 55.00 |
| 13. | CR පිටු 80 පොත් (ඇට්ලස් | 90.75 | 91.00 | 95.00 |
| 14. | CR පිටු 120 පොත් (ඇට්ලස් ) | 131.75 | 132.50 | 135.00 |
| 15. | CR පිටු 160 පොත් (ඇට්ලස් ) | 159.30 | 160.00 | 170.00 |
| 16. | CR පිටු 200 පොත් (ඇට්ලස් ) | 185.30 | 190.00 | 195.00 |
| 17. | 3 ½ x 6 ලිපි කවර (නො 01) | 95.00 100 nos | 97.00 indian 100 nos | 100.00 |
| 18. | 9 x 4 ලිපි කවර (නො 01) | 180.00 100 nos | 185.00 indian manila 100 nos | 190.00 |
| 19. | 9 ½ x 4 ½ චෙක් කවර (නො 01) | 210.00 100 nos | 220.00 indian manila 100 nos | 210.00 |

| | | | | |
|---|---|---|---|---|
| 20. | 12 x 10 ලිපි කවර (නො 01) | 600.00 100 nos | 610.00 | 620.00 |
| 21. | 15 x 10 ලිපි කවර (නො 01) | 700.00 100 nos | 710.00 indian manila 100 nos | 720.00 |
| 22. | 9 x 6 ලිපි කවර (නො 01) | 285.00 100 nos | 290.00 100 nos | 300.00 |
| 23. | චීප් බෝඩ් | 40.00 | 42.00 | 45.00 |
| 24. | පෝස්ට් ස්ටික් (කුඩා No 1) 3ං3 | 70.00 strip | 72.50 | 85.00 |
| 25. | ටිපෙක්ස් | 65.00 primium | 70.00 | 70.00 |
| 26. | ඔයිල් පේපර් | 9.00 whit | 10.00 | 10.00 whit |
| 27. | සෙලෝ ටේප් අගල් 2 | 225.00 100m<br>32.00 normal | 230.00 100m | 140.00 100m |
| 28. | ෆයිල් කටු පෙට්ටි | 39.00 | 40.00 | 42.00 |
| 29. | ෆයිල් ලේස් (පොඩි No 2) 24<br>(ලොකු No 1)18 | 1.59 mettal tip<br>2.20plastic<br>1.80plastic | 230.00 plastic 24<br>195.00 plastic 18 | 3.00 plastic<br>2.00 plastic |
| 30. | ෆැක්ස් රෝල (No-210x30x12'5) | 240.00 30m control | 260.00 30m control | 270.00 30m control |
| 31. | හයලයිට් පෙන් | 60.00 frie fly<br>160.00monami | 165.00 monami | 170.00 |
| 32. | හාෆ් ශීට් පැකට් | 475.00 nalaka | 490.00 nalaka | 485.00 nalaka |
| 33. | ලීගල් ෆොටෝ කොපි පැකට් 01 | 1390.00 80gsm | 1410.00 80gsm | 1490.00 80gsm |
| 34. | කබන් තනිපිට පැකට් 01 | 490.00 universal | 500.00 universal | 510.00 universal |
| 35. | කාබන් දෙපිට පැකට් 01 | 495.00 universal | 510.00 universal | 510.00 universal |
| 36. | ෆීල්ඩ් නෝට් බුක් 01 | 95.00 nalaka | 102.00 | 120.00 |
| 37. | බයින්ඩර් ගම් 250 ග්‍රෑම් | 145.00 | 147.50 | 155.00maris |
| 38. | බයින්ඩර් ගම් 500 ග්‍රෑම් | 240.00 supper hit | 250.00 | 250.00 maris |
| 39. | පැන්සල් | 22.50 atlas | 23.00 atlas | 25.00 atlas |
| 40. | සෙලෝටේප් අගල් 1 | 110.00 100m<br>32.00 normal | 120.00 100m<br>33.00 | 120.00 100m |
| 41. | බයින්ඩින් ටේපි අගල් 2 | 170.00 | 180.00 | 190.00 |
| 42. | පෑඩ් තින්ත බොතල් | 85.00 hero | 87.00 | 95.00 lancer |
| 43. | .ස්ටෙපිලර් කටු පැකට් නො 10 | 17.00 great wall | 18.00 great wall | 20.00 great wall |
| 44. | ෆයිල් පාස්නර් පෙට්ටි | 160.00 | 165.00 | 170.00 |
| 45. | පින්ස් පෙට්ටි | 40.00 | 42.50 | 50.00 |
| 46. | අඩිරූල් (ප්ලාස්ටික්) | 20.00 | 25.00 | 25.00 |
| 47. | ස්ටෑම්ප් පෑඩ් ලොකු | 130.00 lancer | 132.00 | 140.00 artline |
| 48. | රබර් බෑන්ඩ් (මධ්‍යම) | 275.00 250g | 280.00 250g | 280.00 250g |
| 49. | ස්ටෙපිලර් මැෂින් නො 369 | 325.00 cangaru | 335.00 | 350.00 hd 45 |

| | | | | |
|---|---|---|---|---|
| | (කැන්ගරු) | | | |
| 50. | කතුරු (මධ්‍යම) | 60.00 | 62.00 | 70.00 |
| 51. | මකන කෑලි ලෙකු | 9.00 | 10.00 | 10.00 |
| 52. | බොක්ස් ෆයිල් | 245.00 benson / apex | 250.00 benson | 290.00 benson |
| 53. | කැල්කියුලේටර් (CASIO MJ – 120TG) Two way power | 1800.00 casio mj120d | 1900.00 casio mj120d | 1900.00 casio mj120d |
| 54. | සාමාන්‍ය ගම් 200 මිලි | 45.00 | 47.50 | 50.00 |
| 55. | ඩ්‍රොවින් පින්ස් පැකට් 01 | 22.00 | 23.00 | 25.00 |
| 56. | .$A_3$ සුදු පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 | 2200.00 jk 80gsm | 2200.00 jk 80gsm | 2350.00 jk 80gsm |
| 57. | ස්ටෙප්ලර් කටු නො 369 | 40.00 great wall | 42.00 | 45.00 great wall |
| 58. | ස්ටෙප්ලර් මැෂින් නො 10 | 220.00 | 230.00 | 240.00 kangaru |
| 59. | ෆයිල් හෝල්ඩර් benson | 3' - 260.00<br>6' – 328.00 | 3' - 265.00<br>6' – 330.00 | 3' - 280.00 |
| 60. | පන්චර් | 425.00 kangaru dp 600 | 430.00 kangaru dp | 450.00 kangaru dp600 |
| 61. | බ්‍රිස්ටල් බෝඩ් | 24.00 | 25.00 | 26.00 |
| 62. | මාකින් ටේප් | 70.00 1"<br>130.00 2" | 75.00 1"<br>135.00 2" | 80.00 1" |
| 63. | ෆයිල් කලිප් | 39.00 | 40.00 | 42.00 |
| 64. | පුද්ගලික ලිපිගොනු කවර | 130.00 | 132.00 | 140.00 |
| 65. | රූල් සහිත ෆීල්ඩ් නෝට් බුක් | 40.00 80p | 42.00 | 50.00 |
| 66. | මකන | 9.00 | 10.00 | 10.00 |
| 67. | පෝස්ට් ස්ටික් | 70.00 full sheet | 72.00 full sheet | 95.00 full sheet |
| 68. | ෆීල්ඩ් නෝට් බුක් (ස්පයිරල්) | 95.00 | 102.00 | 120.00 |
| 69. | Epson LQ 2090 Ribon | 3395.00 | 3395.00 | 3450.00 |
| 70. | Jolimark DP 350 Ribon | - | - | - |
| 71. | බුල්ඩෝ ක්ලිප් | 2 22.00<br>3 35.00 | 2 25.00<br>3 37.50 | 2 28.00 |
| 72. | පරිඝණක කඩදාසි 9.5 X11 | 1950.00 | 1970.00 | 2100.00 india |
| 73. | පරිඝණක කඩදාසි 15 X12 | 3785.00 indunisia<br>3400.00 india | 3790.00 india | 3500.00 india |
| 74. | රූල් නැති පොත් පිටු 40 | 42.50 atlas | 45.00 atlas | 50.00 atlas |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා උපකරණ සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් සහ ගුණාත්මකභාවය සහ සේවා සැපයීමේ ප්‍රශස්තතාවය නිසා AJG ආයතනයෙන් ලිපිද්‍රව්‍ය හා උපකරණ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

i. 2022 ජනවාරි මස ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් ගිණුම 2022 පෙබරවාරි මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදී.
ii. 2022 ජනවාරි මස මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය 2022 පෙබරවාරි මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදී.
iii. 2022 ජනවාරි මස මාසික ඒකාබද්ධ වියදම් සාරාංශය 2022 පෙබරවාරි මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදී.

**වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී ඉනෝකා නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අද විශේෂ දවසක්. අපි මේ සභාවට ඇවිල්ලා අවුරුදු හතරක් සම්පූර්ණ වෙනවා. සභාවට ඇවිත් පළවෙනි හෝ දෙවන වාරයේ දී මේ සභාවට යෝජනාවක් කළා. උඩවැලිවිටියත්, කැප්පිටියගොඩත් යා කරණ ගිං ගඟ හරහා ඇති පාලම ඉතා අබලන් තත්වයේ පවතිනවා. ඒ නිසා මේ සඳහා මොනවා හරි කරන්න කියලා. ඒ අවස්ථාවේදී පස් පුරවපු බැරල් දෙකක් තියලා, යතුරුපැදි යාම වැළැක්වූවා. මේ අවුරුදු හතරටම කළේ මෙපමණයි.
ඒ වගේම බඩු ටිකක් මිලදී ගැනීම සඳහා බඩු බිලකුත් අරගෙන, නාගොඩ ස.තො.ස ට ගියා. ගෙනියන්න ආපු භාණ්ඩ කිසිම දෙයක් නැහැ කිව්වා. නමුත් ඔබතුමාලා නිතරම කියනවා බඩු වල මිල අඩුවට තියෙනවා. සතොසෙන් ගන්න කියලා. නමුත් ගියහම මොනවත් නැහැ. ජනතාවගේ ජීවන වියදම ඉහළ ගිහිල්ලා. එවැනි ප්‍රශ්න ගොඩක් තියෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම මීට පෙර ඉල්ලීම් කිහිපයක් කළා. විශේෂයෙන් ගෝණදෙනිය දිසානායක මාවත අම්බලම හංදියේ සිට දිසානායක මාවතට සම්බන්ධ කරන මාර්ගයේ පාලම සම්බන්ධව, ඔබතුමා දැනුවත් කරලා, ලිඛිතව ඉල්ලීමක් කළා. තාක්ෂණික නිලධාරීතුමා එක්කගෙන ගිහිල්ලා, අවශ්‍ය කටයුතුත් කළා. නමුත් කියන්න කනගාටුයි. දැන් මාස දෙක තුනකට ආසන්නයි. නමුත් අද වෙනකම් එම ස්ථානය පිළිසකර කිරීම සම්බන්ධයෙන් කිසිම දෙයක් වෙලා නැහැ. ඒ පාලම පාස්සන්න තියෙන්නේ. ඊට පසුව සභාපතිතුමා, මම ඔබතුමාගෙන් ලිඛිත ඉල්ලීමක් කළා. ගෝණදෙනිය කොට්ඨාසයේ වර්ෂා කාලයේ මාර්ගවල පස් කඩාගෙන වැටිලා, මාර්ග අවහිර වෙලා තියෙන්නෙ. මාර්ග අවහිරතා ඉවත් කරන්න කියලා ප්‍රාදේශීය සභාවක් හැටියට, අපි බැඳිලා ඉන්නවා. නමුත් ඒකත් ක්‍රියාත්මක වුණේ නැහැ. හඟරන්වල ප්‍රදේශයේ අපේ පෙරපාසලක් තියෙනවා. මම හිතන්නේ, එම පෙර පාසල දීර්ඝ කාලයක් තිස්සේ ආරම්භ කරලා, රුපියල් දහදාහ බැගින් දීමනාව ලබන පෙර පාසල් පාලිකාවන් තුන්දෙනෙක් සභාවෙ ඉන්නවා. පෙර පාසල් පාලිකාවන් ස්ථිර වීමක් සිද්ධ නොවෙන නිසා, හඟරන්වල පෙර පාසල් පාලිකාව වෙනත් පුද්ගලික ස්ථානයකට යනවා. එවිට මම මේ ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලුම් කළා. මේ පෙර පාසල් වලට ලැබෙන රුපියල් දහදාහක දීමනාවට අමතරව තව රුපියල් දහදාහක් ලබා දීලා හෝ පෙරපාසල් පාලිකාවක් පත්කරන්න කියලා. නමුත් ඒ දේ සිද්ධ වුණේ නැහැ. නමුත් සභාපතිතුමා සම්බන්ධ කළ පෙර පාසල් පාලිකාව දින කිහිපයක් වැඩ කරලා, නැවතුනා. කියන්න කණගාටුයි. අද

අද වන විට හඟරන්වල පෙර පාසල වැහිලා. මේ බලප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් ගත්තම, ඉතාම දුප්පත් මිනිස්සු ටිකක් ඉන්නේ. වතු සමාගමෙනුත් උදව් ඇතිව හිටපු සභාපතිතුමා ආරම්භ කරපු මේ පෙර පාසල සඳහා අවශ්‍ය උපකරණ තියෙනවා. ළමයි 10ක්, 15ක් හිටියා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මම පෞද්ගලිකව පත් කරපු කෙනෙක් නෙවෙයි. ඔබතුමාලා ඉල්ලීම් කරලා දාපු කෙනෙක්ම තමයි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මැතිතුමා**

මම කොට්ඨාස මන්ත්‍රීවරයා ලෙස ඉල්ලීමක් කළා. පාලිකාවක් දාන්න කියලා. ඔබතුමා කිව්වා එතුමියට සහතිකයක් නැහැ. දෙන්න බැහැ කියලා. ඔබතුමා හොඳට මතක් කරලා බලන්න.
නමුත් ඔබතුමා කළ දේට වෙන කෙනෙකුට වරද පටවන්න එපා. මට වඩා සභාවේ සභාපති ලෙස පෙර පාසල් වල වගකීම තියෙන්නේ ඔබතුමාට ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රිතුමා ඒ පෙර පාසල් පාලිකාව, පෙර පාසල කරගෙන යද්දී, ගමේ අය තමයි කකුලෙන් ඇදලා ඒ පෙරපාසල කඩාකප්පල් කරල තියෙන්නෙ. ඒක අභ්‍යන්තර ප්‍රශ්නයක්. එම පෙර පාසලට පහසුකම් වත්තෙන් පවා අරන් දුන්නා. ජලය නැතුව තිබුනේ. ජලය පවා අරන් දුන්නා. මේ ප්‍රශ්නය සම්බන්ධව
පෙර පාසල් විෂය කරණ නිලධාරීන් දන්නවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ඔබතුමා නිදහසට කාරණා කියන්න එපා සභාපතිතුමනි, ඔබතුමාට තිබෙන අසීමිත බලයත් එක්ක, එම පෙර පාසල් වැහෙන්න දෙන්නෙ නැතිව කටයුතු කරන්න ඔබතුමා වගබලා ගත යුතුයි. ප්‍රධාන හේතුව ඔබතුමා දීමනාව ලබා නොදීම. ළමයි පස්දෙනාගෙන් රුපියල් 300ක් හෝ 500 ගණන තමයි එකතු කළේ සභාපතිතුමනි, ඕනැම කෙනෙක් පිනට වැඩ කරන්න කැමති වෙන්නේ නැහැ.
දැන් වෙන්න ඕන ටික වෙලා ඉවරයි. නිදහසට කාරණා වැඩක් නැහැ. ඔබතුමා ලෙඩා මරලා. මන්ත්‍රීධූරය අරගෙන අදට වසර හතරක් වෙනවා. කියන්න කණගාටුයි. මධ්‍යම ආණ්ඩුවෙන් ලැබුණු දේ ඇරෙන්න මේ සභාවෙන් කියලා මොකුත් ලැබිලා නැහැ. අපි ඔබතුමා පත්කරගත්තේ, අපි කොට්ඨාශයට වැඩ කරද්දි, ඔබතුමා මේ පුටුවේ තියල වැඩ කරන්න නෙවෙයි. මුලු සභාවේම වැඩ කටයුතු සිද්ධ කරන්න. අඩුම තරමේ සභාව සතු පෙර පාසල් පහළොවෙ වගකීමවත් ඔබතුමාට ගන්න බැරිනම්, සභාපතිධූරය ඇත්තටම මොකටද කියලා මට හිතෙනවා. ඔබතුමා ලැජ්ජා වෙන්න ඕන. සභාපතිතුමනි, ඔබතුමාගේ සභාපතිත්වය යටතේ මන්ත්‍රීධූරයක් ලබන්න ලැබීම ගැන ඉතාම කනගාටුවට පත් වෙනවා.
ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා සහ ගරු සභාපතිතුමා අතර වචන හුවමාරුවක් විනි.

**ගරු උපසභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා**

කවුරු සභාවේ කතා කළත්, අශිෂ්ට විදිහට කතා කරන්න එපා. මේ සභාවෙ, මේ වගේ කතා ජීවිතේට අහලා නැහැ. අවුරුදු ගාණක් තිස්සේ මේ සභාවේ කවදාවත් ඔහොම වෙලා නැහැ. ගරුත්වය තියාගන්න බලන්න.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා, මම හිතන්නේ අද නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉතිහාසය වෙනස් වුණා කියලා. එවැනි හැසිරීම් රටාවක් දකින්න ලැබුණේ, ඔහු තවම අත්දැකීම් නැති නිසා වෙන්න ඇති. 1992

වර්ෂයේ මෙතනට එනකොට අපටත් අත්දැකීම් තිබුණේ නැහැ. 1992 - 2006 වර්ෂය වෙනකම් ඉඳලා, ඊට පස්සේ නැවතත් අද වෙනකම් මේ සභාවේ ඉන්නවා. ඉතිහාසයේ නම ලියැවෙන ඉතාමත් සංවර සභාවක් ලෙස කටයුතු කරයි කියන එක මම ප්‍රකාශ කරනවා. හිටපු සභාපතිවරු සියලු දෙනාගෙන්ම අඩුපාඩු සිද්ධ වුණා. නමුත් අපි හැසිරිය යුතු රටාවක් තිබුණා. ඒ නිසා මේ වෙලාවේ අපි හිතන්නේ අවුරුදු හතරක් ගිහිල්ලා ඉතිහාසය මකා දැමීම පිළිබඳව අපේ බලවත් කණගාටුව මේ වෙලාවෙ ප්‍රකාශ කරනවා. තරුණ ළමයෙක් නිසා අපි මේ අවස්ථාවේ ඔහුට සමාව දිය යුතු වෙනවා. නමුත් මීට වඩා සංවරශීලී විය යුතුයි. මම හිතන්නේ සභා වාර්තාවෙන් ඒ කොටස ඉවත් කරන්න, අපි එකඟ වෙනවා. මෙතෙක් මේ සභා වාර්තාවේ නොදැකපු දේවල් තමයි සිද්ධවෙන්නේ. ඉදිරියේදී මෙතනට එන්න සිටින කෙනෙක් දැක්කම ඒක හොඳ නැහැ. මෙම නිලධාරීන්ටත් මේක අලුත් අත්දැකීමක් වෙනවා. මොකද අවුරුදු 25 - 30 රාජකාරි කරපු අය ඉන්නවා. මේ පිළිබඳව කතා කරන්න අවශ්‍ය නැහැ. අපි වචන පවා හැසිරෙව්වෙ ඉතා කල්පනාකාරීව. මෙම සභාවේ ගැලරියේ සංදර්ශන තිබුණෙ නැහැ. ඉතාමත් විනයගරුක වැදගත් සභාවක් ලෙස කටයුතු කරමු යන පණිවිඩය අවුරුදු හතරක් සපිරෙන අද දවසේ මම ඔබට දෙනවා. මේ සියලු සභාපතිවරුන්ට වඩා අත්දැකීමක් වර්තමාන සභාපතිතුමා ලැබුවයි කියන එක මම ප්‍රකාශ කරනවා. සභාපතිතුමනි, ඔබතුමාගේ ජීවිතයටත් හොඳ අත්දැකීමක් වෙයි කියලා හිතනවා.
ඒ වගේම පහුගිය දවසේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ දී, කණගාටුදායක දෙයක් සිද්ධ වුණා. ලංකා ඉතිහාසයේ ප්‍රාදේශ ලේකම් කාර්යාල වෙනස් කරපු පුද්ගලයෙක් ඉන්නවා. ඒ තමයි වජිර අබේවර්ධන මැතිතුමා. එතුමා නමින් තිබූ ඵලකය ගලවලා, වෙනත් ඵලකයක් සවි කරලා තිබුණා. නමුත් එතනට පැමිණි චමල් රාජපක්ෂ මහතා අඩුවක් නැතුව වජිර අබේවර්ධන මහතා සම්බන්ධව සිහිපත් කරලා, එතුමාට අවශ්‍ය ගෞරවය ලබා දුන්නා. නමුත් මේ කටයුත්ත කළ නිලධාරියා සම්බන්ධයෙන් ලැජ්ජා වෙනවා. සභාපතිතුමාට ගෞරව කරනවා. ඔබතුමාත් මේ සම්බන්ධව සොයාබලා තිබුන නිසා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක අද ගොඩනැගිලි හදලා තියෙනවා නම්, එහි පියා වජිර අබේවර්ධන යන චරිතයයි. මේ ප්‍රදේශයට ග්‍රාම නිලධාරී කාර්යාල තිබුණෙ නැහැ. නිලධාරීන් හතර පස් දෙනෙක් ඉන්නවා. නිලසෙවන කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, ග්‍රාම සේවා කොට්ඨාස සියල්ලට නිල පියස ඇති කලා. එකම තැනකදි මෙම නිලධාරීන් සියලු දෙනා මුනගැහෙන්න පුළුවන් විදිහට මහජනතාවට පහසුකම් ඇති කළා. රාජ්‍ය ආයතන වලට විශාල සේවාවක් වජිර අබේවර්ධන මැතිතුමා සිදුකළා. ලංකා ඉතිහාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනස් කළ පුද්ගලයෙක් තමයි ඔහු. සභාවේ සිහිනයක් ව තිබුණු ආදාහනාගාරය සඳහා අත්තිවාරම දැම්මෙ ඔහුයි. සභාවේ මුදල් නැතුව ඉන්න අවස්ථාවේ කෝටි දෙකක් දුන්නා. දැන් කෝටි පහක් ක්‍රියාත්මක වෙනවා නෙලුවට ගලි බවුසරය දුන්නා. අපට යාන වාහන දුන්නා. නමුත් එම ඵලකය වෙනස් කළා. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ මුල් අඩිතාලම වජිර අබේවර්ධන චරිතය, මාධ්‍ය හරහා ඒ වෙනස්කම දැකලා, ගාල්ලෙන් නියෝගය ඇවිල්ලා, නැවත ඵලකය තිබ්බා. එහෙමනම් රාජ්‍ය නිලධාරීන්ට වාඩි වෙන්න තැනක් තිබුණෙ නැහැ. නමුත් නිල පියස ඇති කරලා, අහිංසක දුගී දුප්පත් ජනතාවට එක ස්ථානයකදී මෙම නිලධාරී හමු වෙන්න හැකියාව ලැබිලා තියෙනවා. නැවත වරක් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයේදී ඵලකය වෙනස් කිරීම සම්බන්ධව බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා.

තවත් හදවතට වැදුණු දෙයක් තමයි 5 වසර ශිෂ්‍යත්ව විභාග අවස්ථාවේදී, නාගොඩ රාජකීය විද්‍යාලයේදී ඇතිවූ සිද්ධිය සම්බන්ධව. කවුරු කළත් අහිංසක දරු පැටවුන්ගේ අනාගතය සම්බන්ධ යම් සිද්ධියක් වෙලා තියෙනවා. අපි ඒ කටයුත්ත හෙළා දකිනවා. දරුවන් 5 වසර ශිෂ්‍යත්වය විභාගයෙන් සමත් කරන්න උත්සාහ කරන්නේ, දරුවාට හොඳ පාසලක් බලාපොරොත්තුවෙන්. නමුත් නාගොඩ රාජකීය විද්‍යාලයේ දරුවන්ගේ ඉරණම වෙනස් කිරීම සම්බන්ධව, අපගේ බලවත්

කණගාටුව ප්‍රකාශ කරනවා. කවුරු කළත් ඒ දේ කළ ගුරුවරුන් පිළිබඳව පිළිකුලෙන් යුක්තව හෙළා දකිනවා. මේ දරුවන්ගේ මනස දේව කරුණාව ලැබිලා සුවපත් වෙලා වෙනස් වෙන්න ඕන කියලා.

ඒ වගේම රාජ්‍ය නිලධාරියාට මාසේ 25 වන දින වේතනය ලැබෙනවා. විශ්‍රාමිකයටත් ලැබෙනවා. නමුත් මේ රටේ අහිංසක දීමනාවක් ලබන පිරිසක් ඉන්නවා. මම දැක්කා. තැපැල් කන්තෝරුව අසල දීමනාව ගන්න ඉන්නවා. අනේ මහත්තයෝ සමහර දාට මේ දීමනාව ගන්න වෙන්නේ නැහැ කිව්වා. සමහර අවස්ථාවලදී රුපියල් 1900 වගේ පොඩි මුදලක් ගන්න පණිවිඩය ලැබෙන්නෙත් නැහැ. ගෞරවනීය රාජ්‍ය සේවකයට වගේ කොහොමද මේක දැන ගන්නේ. ඒ අසරණ මිනිසුන්ට එම දීමනාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් හදන්න. ඔවුන් පාරෙ රස්තියාදු කරන්නෙ නැතුව. සමාජ සේවා අමාත්‍යාංශයට දැනුම් දෙන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දෙන්න. මේ මිනිස්සු පාරවල් ගානෙ රස්තියාදු කරවන්න එපා. වැදගත් විදිහට මේ දීමනාව දෙන්න ක්‍රමවේදයක් හදන්න කියලා යෝජනාවක් ඉදිරිපත් කරන්න.

ආණ්ඩුව ගැන කතා කරනවා නම් වැඩක් නැහැ බස් ගාස්තු සම්බන්ධයෙන් බස් රථයේ නැගිටලා ගියහම බස් ගාස්තු අඩුයිලු.

ඒ වගේම හාල් සම්බන්ධයෙන් වස විස නැති ලොවක්, රටක් කියපු මිනිස්සු මියන්මාරයෙන් ඉටි හාල් මිනිස්සුන්ට දෙනවා. අනාගත මිනිස් පරපුර ඉවරයි. හැදෙන ලෙඩේ විශේෂඥ වෛද්‍යවරුන්ටවත් හොයාගන්න බැරි වෙයි. අපි මේ දේ හෙළා දකිනවා. මේක කෘතිම හාලක්.

ඒවගේම භාණ්ඩ වැඩි මිළට වික්කම දඩ ගහනවා කිව්වා. සිමෙන්ති වැඩි මිලට විකුණනවා සියලු කර්මාන්ත කඩා වැටිලා. තමුන්නාන්සේලාගේ වැඩ ලක්ෂයක් පටන් ගත්ත රටේ, ආර්ථිකය කාබාසිනියා වෙලා. දරු පැටවුන්ට කිරිපිටි නැවක් නිදහස් කරල දුන්න නම් මේවට වඩා වටිනවා. රටේ දැන් තේ ආර්ථිකය විනාශ වෙලා. තව අවුරුදු දෙක තුනක් යනකොට, රටේ ජාතියත් නැති වෙයි. දෙවියන්ගෙම පිහිටයි. මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

මම සභාවෙන් විශේෂ අවසරයක් ඉල්ලනවා. මාගෙන් සිදුවූ වැරැද්ද සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා. මට කලින් වැට පැන්නෙ සභාපතිතුමා. ඒ වගේම මගේ පියා සම්බන්ධයෙන් කතා කිරීම ගැන මම කනගාටු වෙනවා. මොකද එතුමා මේ අවස්ථාවට අදාලම නැහැ. නමුත් මගේ අතින් යම් වචන මාලාවක් පිට වුනා. ඒ සම්බන්ධයෙන් මේ මුළු සභාවෙන් මම සමාව ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙළී වක්වැල්ල මහත්මිය**

වසර හතරක් අවසාන වන මේ මොහොතේ, සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් කනගාටුව ප්‍රකාශ කරනවා. නමුත් දැන් ධනංජය මන්ත්‍රීතුමා කිව්වා සමාව ගන්නවා කියලා. කොහොම නමුත්, හිතේ ලොකු දුකක් ඇති වුණා. වෙන සභාවන්වල වතුර බෝතල් වලින් ගහගන්නවා. නමුත් මොන ප්‍රශ්නයක් ආවත්, අපි විසිහත් දෙනා හැමෝටම ආදර්ශයක් විදිහට හිටියා. මේක සභාවට හොඳ ආදර්ශයක්. එතුමගේ 15 දෙනාට විතරක් දුන්නා, අපට දුන්නේ නැහැ කියලා අපි කියන්න යන්නේ නැහැ. එතුමා හොඳ නිසා හිතේ ලොකු ගෞරවයක් තියෙනවා. අපේ එක යෝජනාවක් හරි කරන්න, සභාපතිතුමාට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

පළමුවෙන්ම ගරු සභාපතිතුමාට ස්තුති කරන්න කැමතියි. water board එකෙන් කඩපු හෝමදොල පාලමේ පැති බැම්ම සකස් කර දීම සම්බන්ධව.

ඒ වගේම අද සිදුවුනු සිද්ධිය සම්බන්ධව ආධුනික මන්ත්‍රීවරුන් ලෙස සමාව අයදින ගමන්, ගරු සභාපතිතුමනි, පුංචි ඉල්ලීමක් කරන්න කැමතියි. අපි නවක මන්ත්‍රීවරු විදිහට යෝජනාවක් දාද්දි, අපෙන් අඩුපාඩු සිද්ධ වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා ශ්‍රේෂ්ඨ මන්ත්‍රීවරයෙක් විදිහටත්, ඉහළ සභාපතිවරයෙක් විදිහටත්, ඔබතුමා දන්නවා. මෙතන වෙන්නෙ මොනවද කියලා. ගරු සභාපතිතුමනි, අපෙන් වන අඩුපාඩු වලට ඔබතුමන් ඉක්මන් වෙනවා වැඩිද කියලා හිතෙනවා. සභාපතිතුමනි, අර කැඩිච්ච පාර සම්බන්ධව සොයා බලා කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ඒ වගේම කපල්විල ජනතාව බෝක්කු හතරක් ඉල්ලලා, ගිය සභාවේ යෝජනාවක් දාලා ඇති. ඒ දේ කරලා දෙන්න සභාපතිතුමනි. දැඩි දුෂ්කරතා මත තමයි ගමන් කරන්නේ. මේ අවස්ථාවේ මට මතක් වෙනවා. බුදුන් වදාළ දේශනයක් සම්බන්ධව. පුත දීඝායු දුර බලන්න. ළඟ නොබලන්න. මනෝ මූලිකත්වයක් නැතුව සමාජගතවුනහම, ඔහොම තමයි වෙන්නෙ සභාපතිතුමනි. විලේගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කලා වගේ, පෙර පාසල් 15යි අපට තියෙන්නේ. ඒවා ආරක්ෂා කරගන්න ඕන. ළඟම පාසල තමයි හොඳම පාසල. දැන් ළඟම පාසල වහලා, ගාල්ලට තමයි ළමයා යවන්නේ. කුඹුරුහේන පාසල බොහොම අමාරුවෙන් හදාගත්තෙ. ඊට පස්සේ ඒක වහලා දැම්මා. ගමේ ළමයා සපත්තු ගන්න සල්ලි නැතිව සෙරෙප්පු දෙකක් දාගෙන ගමේ පාසලට ගියේ. නමුත් මේ රජය හා ආණ්ඩුව ඒ දේ නැති කලා. ඒ ගැන කණගාටුයි. පෙර පාසලක් වැහෙනවා කියන්නේ, හිරගෙවල් දහසක් අරිනවා වගේ දෙයක්. 215 b ග්‍රාම නිලධාරී වසමට රාජ්‍ය ආයතන දෙකයි තිබුණේ. එකක් තැපැල් කාර්යාලය, හා කුඹුරුහේන පාසල. පාසල වැසීම සම්බන්ධව මට ඇත්තටම කණගාටුයි. අපි දන්න නීතිය අනුව එක ළමයෙක් හරි ඉන්නවනම්, ඒ පාසල වහලා දාන්න බැහැ. ළමයි මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා. ඒ වගේම තල්ගස්වල තේ කර්මාන්ත ශාලාව වැහිලා, ඒ කර්මාන්ත ශාලාවෙ අහිංසක දුප්පත් අම්මලා වැඩ කළේ. රැකියාව අහිමි වෙලා, මන්දපෝෂණය හැදිලා දරුවෝ නැති වේවි. ග්‍රාමීය රෝහලේ බෙහෙත් නැහැ. අර්ථසාධක අරමුදලටත් විදින්න යන්නේ. 25% ක් කපා ගන්න. මිනිස්සුන්ට කිසිම සහනයක් නැහැ. ආර්ථිකය සහ මිනිසුන්ගේ ජීවිත පල්ලෙහාට දාලා තියෙන්නෙ. කුකුළු පැටව් බලෙන් දීලා තියෙන්නෙ නමුත් ඔවුන්ගේ පඩිය දිනකට රුපියල් 1000 යි. ඉතින් කොහොමද කුකුළු පැටවුන්ට කෑම අරන් දෙන්නේ. ඒ වගේම මම ඉදිරිපත් කළ යෝජනා වලට වැඩපිළිවෙළක් ඉදිරිපත් කරන්න. මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. මම හිතන්නේ ගෝණදෙණියේ කොට්ඨාශය ගැන යම් කාරණයක් කතා වුන නිසා, මම ඒ දේට යමක් එකතු කරන්න ඕන. ගෝණදෙනිය කොට්ඨාසයේ පස්කඳු කඩා වැටීම් වලට සහනයක් ලැබුණේ නැහැ කියලා මන්ත්‍රීවරයෙක්ගෙන් ප්‍රකාශයක් සිදු වුනා. නමුත් දවස් දෙක තුනක් ඇතුළත යම් සහනදායී වැඩපිළිවෙළක් සභාවෙන් පටන් ගත්තා. මම දන්නෙ නැහැ කොයිතරම් දුරට, 100% ක් ඉවර වුනාද කියලා. අක්කර 72 ප්‍රදේශයේ, දින තුනක් තිස්සේ යන්න බැරිව තිබුණේ. යන්න පුළුවන් ආකාරයට සකස් කරලා, සහයෝගය ලබා දුන්නා. ඉල්ලීම් බොහොමයක් තියෙන්න ඇති. නව ඉල්ලීම් ඇති. එතුමා දින 2-3 ඇතුලත ඒ දේ සිදු කළා. ඒ වෙනුවෙන් සියළු දෙනාට ස්තූතිවන්ත වෙනවා. ගෞරවයෙන් සිහිපත් කරනවා. කිසි දෙයක් කලා නොවේ. කළා.

තේ වගාව ගැන, තේ කම්හල් ගැන කතාකළා. මහලියද්ද තේ කම්හල මම පුද්ගලිකව දන්නවා. දවසක් ඇර දවසක් තේ ඇඹරුම් කටයුතු කරනවා. අපේ ගෙවල් ආසන්නයෙනුත් කිහිපදෙනෙක් වැඩට යනවා. ඒ අයටත් දැන් වැඩ නැහැ. කෙසේ වෙතත් පැවිල්ල, තේ පොහොර ආදී හැම ප්‍රශ්නයක්ම මේ සිද්ධි වලට බලපාන්න ඇති. ඒත් ඒ තේ කම්හල්වලින් හම්බකරගත් මිනිසුන්ගේ ආර්ථිකය කඩාවැටිලා. අපි කොහොම කතා කලත්, එළියට ගිහිල්ලා කතා කරද්දි, මේ දේ තමයි කතා කරන්නේ.

ගරු සභාපතිතුමනි, අවුරුදු හතරක් අවසන්වෙලා, සිදු වුණු කාරණයක් සම්බන්ධයෙන්, මම කනගාටු වෙන්නේ නැහැ. මොකද ඒක ඔබතුමන්ට වෙන්න ඕන දෙයක්. හිතවත්කමට, ඥාතීත්වයට සැලකුවෙ නැහැ. ඔබතුමා හරිම දේශපාලඥයෙක්. ඔබතුමා, ඔබතුමාගේ කණ්ඩායමත් එක්ක, ඔබතුමාගේ රජයේ වැඩපිළිවෙල ඉදිරියට ගෙනියන්න ඔබතුමා කටයුතු කලා. මොන ආකාරයෙන් උදව් ඉල්ලුවත් ඔබතුමාට ඡන්දය ලබා දෙන අයටවත් ඔබතුමා සහයෝගයක් ලබා දුන්නේ නැහැ. පොදු අරමුදලෙන් ඔබතුමා සලකපු අය, ඔබතුමාට ඔය ආකාරයෙන් සැලකීම සම්බන්ධව මා කනගාටු වෙන්නේ නැහැ. ඔබතුමාට දැන්වත් තේරෙයි. ඔබතුමා සැලකුවාට, ලැබෙන ප්‍රතිඵල අනුව, ඔය ආරම්භයක් විතරයි. ඔබතුමා කල්පනා කරලා, අපේ අනෙක් මන්ත්‍රීවරුන්ට දැන්වත් හරි සාධාරණයක් කරන්න.

මම බැලුවා මාසෙකට රුපියල් 19000ක් අපේ මන්ත්‍රීවරයෙකුට දීමනාව වශයෙන් ලැබෙනවා. අවුරුදු හතරක කාලයකට, 19000X48 අපි සියලු දෙනාට ලක්ෂ 250ක් වැඩි මුදලක් රජයෙන් මහජනතාවගේ මුදලින් අපි අරගෙන තියෙනවා. මේ මුදල් වලට අපි සභාවට ඇවිල්ලා, මහජනතාවට කළ සාධාරණත්වය මොකද්ද කියලා හිතෙනවා. මන්ත්‍රීවරයෙක් විදියට මම කනගාටුවට පත් වෙනවා. යහපාලනය කාලයේ අපි විශාල සංවර්ධන කටයුතු කළා. නමුත් මේ රජය මැති ඇමතිවරුන්ට කියලවත් පුද්ගලිකවත් යමක් කරගන්න බෑ කියනවා. මන්ත්‍රීධූරය හරහා කිසි දෙයක් කරගන්න බැරි වුණා. ඔබතුමාටත් බැරිවුණා කියලා තමයි මම විශ්වාස කරන්නේ. යම් යම් දේවල්, ඒ කාලෙ හරි, මොන කාලෙ හරි, අනුමත වෙලා, වර්තමාන රජයෙන් හරි, පිටරට ආධාර වලින්, හරි කරගෙන යන දේවල් කරගෙන යනවා මිසක්, සාර්ථකත්වයට පත් වුණා කියන්න බැහැ.

අපේ වනිගරත්න මන්ත්‍රීතුමා නියෝජනය කරන කොට්ඨාසයේ ඉහලගම බස් එක 2011 වර්ෂයේ සිට කතා කරගෙන අපි පටන් ගත්තෙ. සතියක් දෙකක් ධාවනය වුණා. ඊට පසුව බස් එක හෝමදොල හන්දියෙන් හරවනවා. ඒ ගැන කිසිම වග විභාගයක් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, අපේ නිලධාරීන්ගෙන් සහ ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා. ඒ අදාළ ආයතන දැනුවත් කරලා කටයුතු කරන්න කියලා. බස් එකේ ආරම්භය ඉහළගම. රූට් පර්මිට් එකක් දෙන විදිහ දන්නවා. ගමනාන්තය වන කරාපිටියට යන්න ඕන. නමුත් ඒ බස් එක දුවන්නෙ නැහැ. ලංකා ගමනාගමන මණ්ඩලයට ඕන විදිහට තමයි ඒක කරන්නේ.

දැන් පාරවල් කාපට් කරලා, නමුත් බස් එක හෝමදොල - කරාපිටිය තමයි ධාවනය වෙන්නෙ. ඉහලගම ප්‍රදේශයේ සිටින අහිංසක ජනතාව රුපියල් තුන්සීයක් දීලා හෝමදොල හංදියට එන්න ඕන. කරාපිටියට යන්න නම්. අහිංසක දුප්පත් ජනතාව අසරණයි. මේ සම්බන්ධයෙන් ඩිපෝව වෙත දන්වන්න කියල ඉල්ලා සිටිනවා.

උඩුගම අක්කර 80, 19 කන්ද රජයේ ඉඩමක් නඩු දාලා තියෙනවා. එම්.පී.ජී. රොෂාන් ප්‍රියංකර කියලා අනවසර පදිංචි වුන පුද්ගලයකුට. පොඩි ළමයි තුන් හතර දෙනෙක් එක්ක ලැලි ගහපු පොඩි ගෙදරක ඉන්නේ. රජයෙන් ලයිට් දීල තියෙනවා. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නඩු දාලා තියෙනවා. පදිංචි කාරයෝ තුන්දෙනාගෙන් එක් කෙනෙකුට නීතිය ක්‍රියාත්මක කරලා. ඒ ඉඩමේ ඉන්න අනෙක් දෙපලට නීතිය ක්‍රියාත්මක වෙලා නැහැ. එක ග්‍රාම නිලධාරී, එකම ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශය නීතිය ක්‍රියාත්මක කරන්නේ එක එක ආකාරයට. මේ සම්බන්ධව දේශපාලන වශයෙනුත් හොයල බලන්න සභාපතිතුමනි.

උඩුගම නැගෙනහිර පාසලට ආසන්නව ගල්බැදිදොල පාලමක් ඉදි කළා. එම පාලම කඩා ගෙන ගිහිල්ලා, ගල්බැදිදොළ ඒ ප්‍රදේශයේ මිනිස්සු අපහසුතාවයට පත්වෙලා තියෙනවා. පසුගිය දවස්වල ඉසුරු දොඩංගොඩ මැතිතුමා යම්කිසි මුදලක් පාස් කළා කියලා තියෙනවා. සභාපතිතුමනි, ඒ මුදල මදි ඇති. අපේ ප්‍රාදේශීය සභාවෙන් ඉවත් කරන පාලමක් හරි දාලා, කුමක් හෝ විසඳුමක් දීලා, යම් ආකාරයකට යෝජනාවකට ඇතුලත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

උඩුගම හිනිදුම දක්වා දිවෙන මාර්ගය KDAW සමාගම ඉතාම උසස් ආකාරයෙන් පටන්ගෙන දැන් ඕනවට එපාවට වැඩ කරන්නෙ. ඊට හේතුවකළමනාකාරිත්වය වෙනස් වෙලා තියෙනවා. වර්තමාන කළමනාකාරිත්වය මහජනතාව පීඩාවට පත්වුණ ආකාරයට තමයි කටයුතු කරන්නේ. ඔවුන්ව දැනුවත් කරන්න කියල ඉල්ලා සිටිනවා. ගෝණදෙනිය අම්බලම ලඟ, පන්සල ළඟ, ඉඩම් වලට පස් දාලා, කුඹුරු ගොඩ කරලා, සභාවෙන් අවසර නොගෙන, ඔවුන් සමඟ සාකච්ඡා කරලා, ගම්වාසීන්ගේ ඉල්ලීම් පිළිබඳව දැනුවත් කරන්න.

ඒ වගේම වාහනවල දුම් පරීක්ෂණ කටයුතු සිදු වෙනවා. උඩුගම නාගොඩ ප්‍රදේශවල පහසුකම් මදි. අපි රජයට බදු ගෙවද්දිත්, ඇයි සුදුසුකම් සහිත ස්ථාන තෝර ගන්න බැරි. අනතුරු බහුලව සිදු වෙනවා. ඒ කටයුතු සඳහා පහසුකම් ඇති ස්ථාන තෝරගන්න කියලා ඒ ආයතන වලට දැනුම් දෙන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

මාපලගම මහජන ක්‍රීඩාංගනයේ මේ වන විට වැඩ අවසන් වෙලා තියෙනවා. එහි කොන්ක්‍රීට් කාණු පද්ධතියේ, අවසානයේ වතුර බහින්න ස්ථානයක් නැහැ. ගෙවල් තුනක් යට වෙනවා. මම හිතන්නේ ඔබතුමා ඔවුන්ට පොරොන්දු වුණා. පාර හරහා කපලා, කාණු පද්ධතියක් දාලා දෙනවා කියලා. එය ඉතා ඉක්මනින් කරන්න. වර්ෂාව ආවොත් අපට ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා ඉතා ඉක්මනින් බෝක්කු කටවල් දෙකක් ලබා දෙන්න.

ඒ වගේම අපේ මන්ත්‍රීවරු ටික ප්‍රවෘත්ති බලනවා. ඔය කියන ටික තමයි දැන් හැමදාම කියන්නේ. කරපු හොඳ වැඩ ටිකකුත් තියෙනවනෙ. ඒවා අපේ මන්ත්‍රීවරු කවදාවත්ම කියන්නේ නැහැ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා දන්නේ නැහැ. තල්ගස්වල කර්මාන්තශාලාව වැහුණෙ ඇයි කියලා. එහි පරිපාලනය සම්බන්ධයෙන් වුනු වරදකින් තමයි ඒක වැහුවේ. එහි දෙවැනි පරිපාලකයා කටුපොල් ව්‍යාපෘතිය සමඟ බැඳිලා ඉන්නවා. දලුවලින් පාඩු වින්ඳා. නමුත් පෞද්ගලික වුවමනාව තිබුණා. මේක නවත්වන්න. දලු හිමියන්ගේ දීමනාවන් සියල්ල නවත්තපු නිසා කවුරුත් දළු දෙන්නෙ නැහැ. ඒකයි සිද්ධ වුණේ. ඊට වඩා සේවකයෝ යොදවලා, කටුපොල් ව්‍යාපාරය කරගෙන යනවා. ජයවීර මන්ත්‍රීතුමා දන්නවා වුනත් කියන්නෙ නැහැ. එහෙමනම් මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බොහෝම ස්තූතියි.

**ගරු මන්ත්‍රීනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

පුරා වසර හතරක් අවසන් වන මොහොතේ, පක්ෂ විපක්ෂ වලින් තොරව, මේ සභාව තුළ ඉතා හොඳින් කටයුතු සිදුකළා. ඒ ගැන ආඩම්බර වෙනවා. ඒ පිළිබඳව සිහිපත් කරන්න ඕන. මේ ඉනෝකා මන්ත්‍රීතුමිය මතක් කරනවා. කැප්පිටියගොඩ වැලිවිටිය යාකරන පාළම සම්බන්ධව වසර හතරක් පුරා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළ තමයි අපි තේරී පත් වුනේ. වසර දෙකක කාලයක් තුළ තමයි අපට

කටයුතු කරන්න සිද්ධ වුණේ. ඒ වසර දෙක තුළ ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් සේවාව, අපට පුළුවන් ආකාරයෙන් ඉෂ්ට සිද්ධ කළා. මුළු ලෝකයම වසාගත් කොවිඩ් වසංගත තත්වය තුළ, අපට කරන වැඩවල යම් පසුබෑමක් සිද්ධ වුණා. නමුත් ඒ වසර දෙක තුළ අපි කටයුතු සිදු කළා. ඉනෝකා මන්ත්‍රීතුමියට පාලම පිළිබඳව කටයුතු කරගන්න බැරි වීම පිළිබඳවත්, ලක්රුවන් මන්ත්‍රීතුමා කිහිප වතාවක්ම කතා කරලා, ඒ කටයුත්ත ඉදිරියේ දී වැඩ අවසන් කර ගැනීමට කටයුතු කරනවා.

එක්සත් ජාතික පක්ෂය ආ කාලයේ, ඔවුන්ගේ පාලන කාලය තුල පාලම් කටයුතුවල වැඩ කළා. ඇයට කුමන හෝ හේතුවක් නිසා එය කර ගැනීමේ හැකියාව නැතිවෙලා තියෙනවා. එහෙම නැත්නම් මන්ත්‍රීතුමියට අද ඒ තත්ත්වයට මුහුණ දෙන්න වෙන්නෙ නැහැ. ඒ වගේම මගේ ගේ ඉදිරිපිට, නාගොඩ වත්තේ තේ කර්මාන්ත ශාලාව වහල දාල තියෙන්නෙ. බලධාරීන්ගේ අවධානයට යොමු වෙලා නැහැ. අවසාන වශයෙන්, අපි සියලු දෙනාගේ සුහදත්වය වර්ධනය කරගැනීමට, වාර්ෂික විනෝද චාරිකාව යමු කියලා ආරාධනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

මූලාසනයෙන් අවසරයි. අවුරුදු හතරක් ප්‍රාදේශීය සභාවේ කාලය අවසන් වෙලා, වර්ෂයකින් දීර්ඝ කරපු අවස්ථාවක, පක්ෂ පාට වලින් තොරව, ඉතාමත් අසීරු තත්ත්වයකට පත්වී ඇති අවස්ථාවකදී, පාලක පක්ෂය හැටියට ප්‍රාදේශීය සභා බලය විපක්ෂයට ගිහිල්ලා, අපි සභාපතිවරු, උප සභාපතිවරු, මන්ත්‍රීවරු ලෙස පත් වෙලා, අපි කාටවත් ඇඟිල්ල දික් කරලා කියන්න දෙයක් නැහැ. අපි හිටියත් එහෙම තමයි. කිසි කෙනෙකුට කිසිම දෙයක් කර ගැනීමේ හැකියාව නැහැ. තරුණ පිරිස මන්ත්‍රී ධුරය පිළිබඳව කළකිරීමට පත් වෙලා, ඉතාම ඛේදනීය තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ආණ්ඩුව පිහිටුවලා බලයට ආවට පස්සෙ, කිසිම වෙලාවකවත් අපේ මන්ත්‍රීකමෙන් යම් සේවාවක් කරන්න බැරිවූ අවස්ථා තියෙනවා. ඒක බරපතළ කනගාටුදායක තත්ත්වයක්. ඉදිරි දේශපාලන පැවැත්ම පිළිබඳවත් ප්‍රශ්නයක් වෙනවා. මේ ප්‍රාදේශීය දේශපාලඥයන් සමාජය තුළ කවුරුවත් ගණන් ගන්නේ නැති තත්වයකට පත් වෙලා තියෙනවා. මේක සංගායනාවක් කරන්න ඕන දෙයක්. ඒ සියලු දෙනාගේ කුණු හෝදන එක තමයි අපි කරන්නේ. තරංග මන්ත්‍රීතුමා කිව්වට අපි මෙතරම් මුදලක් අරගෙන තියෙනවා කියලා, ඇත්තටම මම නම් මේ සභාවට උපරිමයෙන්, තමන්ට හැකි ප්‍රමාණයෙන් යමක් කරලා තියෙනවා.

මගේ කොට්ඨාශය ගැන කතා කරද්දී මේ වකවානුවේදී 100% ක් යමක් කරගන්න නොහැකි වුනත්, මම විශ්වාස කරනවා අවුරුදු දෙකක් වැනි කෙටි කාලයක් තුළ, ලක්ෂ හයක්, මගේ කොට්ටාශයේ ගෙවල් දාසයක වැඩ මේ වන විට අවසන් කරලා තියෙනවා. මේ කොට්ඨාසයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාල මහතාගේ ආශිර්වාදයෙන් හා ගරු සභාපතිතුමාගේ මගපෙන්වීම යටතේ, උඩවැලිවිටිය කොට්ඨාසයේ අතු පැලවල් වල හිටිය මිනිසුන්ට ගෙවල් දාසයක් හදන්න ලැබීම සත් ක්‍රියාවක් ලෙස දකිනවා. නාගොඩ බද්දෙගම හරහා කිලෝමීටර් 7.5 ක් හෙට දවසේ කාපට් කිරීමේ කටයුතු කරන්න තියෙනවා සභාවේ ලොකුම මාර්ගයක් ලෙස කටයුතු කරන මාර්ගයක් තමයි ඒක.

නීත්‍යානුකූලව නොවුනත් L15881 දරන උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගයේ නඩුව සම්බන්ධ තීන්දුව ලබා දුන්නා. මීට ඉහතදී උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ සඳහා පිටවූ පාර ගඟට කඩාගෙන ගිහිල්ලා තියෙන්නෙ. ඒ නිසා තමයි විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කරන්නේ. ඒ කොහොම වුණත්, ඒ ඉඩම් හිමියට රු. ලක්ෂයක මුදලක් ගෙවන්න තියෙනවා. තීන්දුව ලබා දුන්නා. විත්තිකරු පොලීසියෙ පැමිණිල්ලක් දාලා, එහෙම මුදලක් ගෙවන්න කියලා තීන්දුවක් ලබා දුන්නා. අද ඒ ගමට යන්න තියෙන එකම මාර්ගය ඒක. එම මාර්ගයේ සියලුම කොටස් මේ වන විට ගඟට හෝදගෙන ගිහිල්ලා තියෙන්නෙ. ඒ අනුව තමයි මේ විකල්ප මාර්ගය මේ විදිහට භාවිතා කරලා

තියෙන්නේ. වන්දි ඉල්ලපු පුද්ගලයත් මේ වන විට මිය ගිහිල්ලා. මම හිතන්නේ එතුමාගේ පුත්තු ඉදිරිපත් වෙලා තියෙනවා. එම මුදල් ඔවුන් ලබා ගනීවි කියලා විශ්වාසයක් මම හිතන්නේ නැහැ. ඔවුන් නඩුවට සති දෙකකට කලින් හමුවෙලා, කාගෙන්ද මේවා අපි අය කරන්නේ කියන එක සඳහන් කළා. 2007 වර්ෂයේ සිට අවුරුද්දකට උඩදී තමයි, මේක සභාවෙන් ගෙවන්න ඕන කියලා තීරණය කරගත්තේ. අජිත් එඩේරආරච්චි මැතිතුමා සභාවේ සභාපතිත්වය දරන කාලෙ තමයි නඩු කටයුත්ත පටන් ගත්තේ. මේ කටයුත්ත නඩුවකින් තොරව, අවසන් කරගන්න එතුමා දැඩි උත්සාහයක් කලා. නමුත් හැකි වුණේ නැහැ. මේ නඩුව වෙනුවෙන් ලක්ෂ 12 ක පමණ මුදලක් සභාවෙන් දරන්න සිදු වුණා. අපේ සභාපතිතුමා පළාත් පාලනයට යවලා, අනුමැතිය ලබාගෙන, මුදල් ගෙවන තුරු, රුපියල් ලක්ෂ 12 ක මුදලක් මම පෞද්ගලිකව දරල තියෙනවා. ඒ වගේම ඒ මුදල් ගෙවීම සම්බන්ධයෙන් අදාල නීතිඥතුමිය ළඟ සාක්ෂි තියෙනවා. දීර්ඝකාලයක් ගම වෙනුවෙන් නඩු කියලා, තීන්දුව ප්‍රකාශයට පත්කරලා තියෙන්නේ. ලබන සභාවට සභාගත කර ගැනීමේ හැකියාව තියෙනවා. නැවත නඩුව ඇපිල් කළොත්, ඊට වඩා මුදලක් යනවා ඒක අපට පාඩුයි.

ඒ වගේම පාරවල් ගැසට් කිරීම සම්බන්ධව පාරවල් කිහිපයක් සඳහන් කළා. මගෙත් පාරවල් කිහිපයක් ගැසට් කිරීමට තියෙනවා. මම ඒ ටික ලේකම්තුමිය ට ලැබෙන්න සලස්වනවා. අද ඇතුළත් කළ නම් ලිස්ට් එකටම ඇතුලත් කරලා, ඒ දේත් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. අපේ කොට්ඨාස වල ඉන්න ග්‍රාම නිලධාරීවරුන් ගේ සහය ඉතාම ඉක්මනින් ලබාගත යුතුයි.
මේ රටේ මේ කාලපරිච්ඡේදය තුළ මේ තත්ත්වය උදා වීම සඳහා මෙතුවක් රටේ වැඩ කරපු නායකයින්, සියලු දෙනාම වගකිව යුතුයි. විදේශවලින් ණය අරගෙන, ණය ගොඩගැහිලා තියෙන වෙලාවක, මේ රටේ ආර්ථික සැළැස්මට එය බෙහෙවින් බලපාල තියෙනවා. අපි සියලු දෙනාම එකතුවෙලා, වැඩ නොකලොත්, ජාතියක් හැටියට ගොඩ එන්න වෙන්නේ නැහැ. සියලු දෙනාටම සුභ අනාගතයක් පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**
ගරු සභාපතිතුමනි, සියලු දෙනාගෙන් අවසරයි. ප්‍රමාදවී සභාවට පැමිණීම සම්බන්ධයෙන්, පළමුවෙන්ම මම සමාව අයැද සිටිනවා. ඊට හේතු වුනේ, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අද පරීක්ෂණය සඳහා නිලධාරීන් සහභාගි වුණා. ඒ අවස්ථාවට මටත් සම්බන්ධවීමට සිදුවුන නිසා. සභාවට වේලාවට එන්න නොහැකිවුනා.
වසර හතරක් පුරාවට සභාවේ විවේචන කර ගත්තත්, ගුටි ගහගන්නේ නැතිව, අපි දෙපාර්ශයම එකතුවෙලා ගමනක් ගියා. ඒ සම්බන්ධව සතුටු වෙනවා. ඒ වගේම නොදත් දේශපාලනය හා සමාජය පිළිබඳව මා ගොඩක් අවබෝධ කරගත්තා. පරිණත දේශපාලන නායකත්වය තුළත්, සමාජයේ විවිධ අය හඳුනා ගැනීම තුළත්, පසුගිය අවුරුදු 4 කාලය තුළ මා ඉතා හොඳ ගමනක් ආවා. ඒ වගේම ඔබතුමාලා සියලු දෙනා ලබාදුන් සහයෝගයට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.
ඒ වගේම ප්‍රදේශවාසීන් විසින් අම්බුව මාර්ගය සම්බන්ධයෙන් ඉල්ලීමක් කරලා, ඔබතුමාට ලිපියක් එවලා තියෙනවා. ඒක ශ්‍රමදාන මට්ටමෙන් හරි කරගන්න කියලා, කාණු පද්ධතිය සකස් කර ගැනීමට යම් සහයෝගයක් දෙන්න කියලා සිහිපත් කරමින්, ජයවීර මන්ත්‍රීතුමාගේ කතාවට හරස් කතාවක් නෙවෙයි මේ කියන්නේ. මම අහල තියෙනවා මේ ප්‍රදේශයේ උක් වගාව ඉතාමත් ශක්තිමත් ව තිබුණා කියලා. ඉන්පසුව රබර් වගාවත්, ඊටත් පසුව තේ වගාවත් ඇතිවෙලා තියෙනවා. දැන් රබර් උක් නැත්තටම නැති වෙලා තියෙනවා. තේ කර්මාන්තය දිහා බලනව නම් වසර ගණනාවකට කලින් ඇට තේ වර්ග වගා කරලා, ඉතා සාර්ථකව මුදල් ලබාගත් කර්මාන්ත තිබුණා දැන් රිකිලි තේ, තේ ගස් ටික මැරිලා යනවා. හැම බීජයක්ම ඒ වගේ. තේ වගාව අවුරුදු එකහමාරෙන් නඩත්තු කරලා, කප්පාදු දෙක යනවිට, ආදායම නැති වෙනවා. වියදම් ගොඩක් දරන්න වෙනවා. මේක මේ ආණ්ඩුවල වෙනස නිසා ඇති වුණ දෙයක් නෙවෙයි. අනවශ්‍ය ලෙස කර්මාන්තශාලා වැඩි වීම නිසාත්, වැසුනු කර්මාන්තශාලා ගැන කතා කරනවා නම්, ආණ්ඩු කාලය ගැන බලන්න එපා. කොච්චර තියෙනවද කියලා බලන්න. පොහොර නැති නිසා දළු අඩු වුණා. නමුත් තේ දළු මිළ වැඩි වුණා. තේ දළු කිලෝ එකට රුපියල් 126 වගේ මුදලක් ලැබුණා. එසේනම් අපි විකල්ප මාර්ග වලට යන්න ඕන. පුරන්

කුඹුරු තියෙනවා. පුරන් කුඹුරු වල උක් වගා කරන්න සාකච්ඡා කරන්න කියලා මම ඉල්ලීම් කරනවා. ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කලාම, ඊට කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා. නිලධාරීන් සම්බන්ධ කරගෙන, අවසර ලබාගෙන කරන්න කියලා මට කිව්වා. ඔබ අහවි, ඒවා විකුනන්නෙ කොහොමද කියලා. ඊට විසඳුම් සොයා ගෙන තියෙන්නේ. වැසී ගිය පාසලක් තියෙනවා. අපි මේ වන විට මේකේ උක් නිශ්පාදනය සඳහා මැෂින් එකක් සවි කරන්න තීරණය කරලා තියෙන්නේ. උක් පැණි වෙළඳපලට නිකුත් කරන ක්‍රමවේදය පවා හදාගෙන තියෙන්නෙ. ඒ නිසා තේ වගාවෙන් ඉවත් වෙන්න නෙවෙයි මම කියන්නේ. තමන්ට ගැලපෙන වගාවකට යන්න පුළුවන්. උක් වගාවට කැමතිනම්, අපි අතහිත දෙන්න බලාගෙන ඉන්නේ. රංජිත් ජයවීර මන්ත්‍රීතුමා, මම කුකුල් පැටවු නම් බලෙන් දුන්නේ නැහැ. අපෙන් 20ක් ඉල්ලුවා. ඒක ඔයාලට මදිනම්, තව දෙන්නම් කියලා, බිත්තර නිෂ්පාදන ගොවිපල හැදුවේ මගේ ගමේ. කුකුළු පැටව් 100ක් මට ඕන කියලා කියපු මිනිස්සු හිටියේ. මම කිව්වා ඔය 20 හරියට හදාගෙන ගියොත්, මාස 6න් ආදායම ගන්න පුළුවන්. තව විස්සක් දෙන්නම් කියලා. ආදායම් උත්පාදන වැඩසටහනක් තමයි කළේ. අපේ ගමේ දුප්පත් මිනිස්සු තෝරාගෙන, ඔවුන් නගා සිටුවන වැඩසටහන් කළා. මම ගෙවල් දහ තුනක් හදලා දීලා තියෙනවා. ඔවුන්ට සල්ලි දීලා විතරක් නෙවෙයි, ඔවුන්ගේ වැඩ කටයුතුවලට ශ්‍රමයෙන් පවා උදව් කළා. මම ඔවුන් දිරිමත් කළා. මාර්ග පද්ධති, ශ්‍රමදාන කරලා, ගමේ දේවල් වලට නායකත්වය දීලා, වැඩ කටයුතු කළා. ඒ වගේම මගේ එකම බලාපොරොත්තුව තමයි පරණතානායම්ගොඩ දුප්පත් මිනිස්සු ඉන්න බැහැ. ජනාධිපතිතුමාගේ නායකත්වය හා ඉදිරි දැක්මත් එක්ක, ඒ තත්ත්වයට මම කොහොමහරි මගේ ගම ගේනවා. අවසාන වශයෙන්, ප්‍රියන්තා මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා වගේ, සුන්දර නුවරඑළිය වාර්ෂික විනෝද චාරිකාව යාම සඳහා සියලු මන්ත්‍රීවරුන්ට සහෝදරත්වයෙන් ආරාධනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ලක් මාතාවට අවුරුදු 74 ගත වෙච්ච මොහොතේ, මම කනගාටු වෙනවා සභාපතිතුමාට මේක අමතක වීම ගැන. මෙතුවක් කල් මේ වගේ ආණ්ඩුවක් මේ රටේ තිබුණෙ නැහැ. මීට පෙර කිසිම ආණ්ඩුවක් තමන් බලයට පත් කළ ජනතාව පීඩනයට පත් කළේ නැහැ. දැන් රට ආගාධයට වැටිලා ඉවරයි. අපට ලැජ්ජයි. බංගලිදේශයෙනුත් ණය ගන්නවලු. මේක නම් අභාග්‍යයේ දැක්ම මම හැමදාම කියනවා. දැන් ඔප්පු වෙලා ඉවරයි.

ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමාගේ කතාවෙදි හැමදේම දෙන්නෙ ඔබතුමා කියලා කිව්වා. කුරුඳු පැළ, කුකුළු පැටවු දෙනවා කිව්වා. නමුත් ගමට නිලධාරීන් හතර දෙනෙක් ඉන්නවා. ඔබතුමා ඔප්පුකරලා ඉවරයි. ඔබතුමා මේකට දේශපාලනය මැදිහත් කරලා ඉවරයි. අපි ඉන්නකොට වසමේ නිලධාරීන් කිසිදේකට අපට මැදිහත් වෙන්න දුන්නේ නැහැ. සමෘද්ධි ලිස්ට් එක හදද්දි ඊට සම්බන්ධ වෙන්නවත් ඉඩ දුන්නේ නැහැ. නමුත් අද ඒ නිලධාරීන් හතර දෙනාට ගමේ යම්කිසි පුද්ගලයෙකුට දෙයක් දෙන්න බැහැ. මොකද ගමේ මන්ත්‍රීවරයා දැනුවත් කරන්න ඕන. ඒ කොලේට අත්සන් තියෙනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

එහෙම තමයි. ඒකෙ වරදක් නැහැ. ඔබතුමා දන්නවනෙ, ඔබතුමන්ලා බලයේ සිටියදී කටයුතු කල ආකාරය.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, අපේ මහා කට්ටිය මොකද කළේ? අදාළ දීමනාලාභීන් තෝරගන්න වසමෙ ඉන්න නිලධාරීන්ට අවස්ථාව දුන්නා. ඒගොල්ලන් හැදුවේ අපේ දේශපාලන රැස්වීමක වුනත් ක්‍රියාකාරීව වැඩ කරන ජනතාවගේ නම් තිබ්බම, නම ඉදිරියෙන් සුදුසුකම් ඇහුවම නැහැ කියලා දාලා තිබුණා. මේක නිවැරදි කරගන්න අපි කොළඹ ගියා. ඒත් අද වෙනකන් අපට ආණ්ඩුව තිබිලත්, අපේ නායකයින්ගෙන් ඒ දේ කරගන්න ලැබුනෙ නැහැ. මේකයි අපට තිබුණ තත්ත්වය. අපේ පරණතානායම්ගොඩ මාර්ග දෙකක් මේ දවස්වල ධර්මසිරි මන්ත්‍රිතුමා වැඩ පටන් ගත්තා. නමුත් එම මාර්ගවල සංවර්ධන කටයුතු අතරමග නතර වෙලා තියෙනවා. අත්‍යවශ්‍ය මාර්ග. ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව සොයා බලන්න.

මාපලගම මලාමුර සෞඛ්‍ය මධ්‍යස්ථානය තියෙන බිමෙහි ඇත්තටම අනවසර පස් කැපීමක් සිද්ධ වෙනවා. මේක ප්‍රාදේශීය ලේකම් තුමාට බලය පවතින ඉඩමක්. අපේ දිල්රුක්ෂි මන්ත්‍රීතුමියත් ඉන්නවා. එතුමියත් දැනුවත් වෙලා ඇති. කන්ද සහිත ඉඩමක් නිසා නායයෑම් වලට ලක් වෙන්න පුළුවන්.
ඒ වගේම, ගව හානිය කුඹුරුවලටත් දැන් වැඩි වශයෙන් තියෙනවා. මිනිසුන්ගේ කුඹුරු ටික විනාශ වෙනවා. සුනඛ හානියත් ඒ වගේමයි. එන්න එන්න වර්ධනය වන තත්ත්වයක් තියෙන්නේ. රටේ ආර්ථික තත්ත්වය බැලුවම, සියලුම භාණ්ඩ වල මිල වැඩි වෙලා. පෙට්‍රල් මිළ වැඩි වෙලා. හොඳ ආර්ථිකයක් හදන්න එතුමට යම් බුද්ධියක් පහල වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා අදහස් දක්වමින්**
වනමල් මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වනේ අනවසර පස් කැපීමක් සම්බන්ධව. ඒ පස් කපන්නේ අපේ සෞඛ්‍ය මධ්‍යස්ථානයට පස් කණ්ඩිය කඩාවැටිලා. දැන් ඒක වහලා තියෙන්නේ අවුරුදු තුනකටත් වැඩියි. ඊට පස්සේ භූවිද්‍යා එකෙන් ඇවිත්, ඒ පස් ටික ඉවත් කරන්න කියලා තිබුණා. නමුත් මොකද පස් කණ්ඩිය මෙහායින් කපන්නේ නැතුව ඒක අයින් කරන්න යන්න විදියක් නැහැ. ඊට පසුව අපි ගොවිජන සේවා කමිටුව වශයෙන් මැදිහත් වෙලා, මලාමුරේ පාරක් ගොඩ කලා. ඒ පස් ටික ඉවත් කරගන්නත්, පාර හදල දෙන්නත් මම ප්‍රාදේශීය ලේකම්තුමාට පොරොන්දු වුණා. නාගොඩ පොලිසියෙ අනු බණ්ඩයක් මලාමුරේ හැදෙනවා. ඉතිරි පස් ටික ඒකට දීලා තියෙනවා. භූමිය සකස් කරගන්න පොලීසියට අවශ්‍යතාවක් තිබුණා. ඔබතුමා පස් කපනවා නම්, අපටත් මේ දේ කරලා දෙන්න කිව්වා. මාගේ පෞද්ගලික මුදලින් මුළු කන්දම මම සුද්ද කළා. පොලීසියට අවශ්‍ය ගෙපලක් කපලා, අර පස් ටික ගැනීමට අපහසු බැවින්, අපි ප්ලෑන් එකක් ඇඳලා, පස් කපන ක්‍රමවේදයට කැපුවා. කට්ට තුනට පස් කපලා තමයි අයින් කරගන්න කියලා තියෙන්නෙ. නමුත් පස් දාන්න තැනක් නැති නිසා, අපි තවම කට්ට එකක්වත් කැපුවෙ නැහැ. නමුත් අපි වැඩේ නවත්තලා නැහැ. අපි පොරොන්දු වූ පරිදි දොරුව අතරින් පස් ටික කම්කරුවෝ දාලා හරි ඇදලා දෙනවා. තවම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ දොර ගාව පස් ටික ගන්න බැරි වුණා. වසන්ත මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ප්‍රමාණවත් ඇති කියලා මම හිතනවා. ඔබතුමා කිව්වා මම අත්සන් කරලා තියෙනවා කියලා. ඔබතුමා දැක්කේ නැද්ද තව හතර දෙනෙක් අත්සන් කරලා තියෙනවා. අදාළ ප්‍රතිලාභීන් හඳුනාගෙන, අපි තමයි හරියටම කළේ, හරියටම කරන්නේ. ස්තුතියි.

**ගරු මන්ත්‍රී එන්. වී. පතිනායක මහතා**
ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඇත්තටම සුනඛයන් සම්බන්ධයෙන් කතා කරන්න මම මෙය අවස්ථාවක් කරගන්නවා. සිරිසුනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයකු මේ සුනඛයකු සපා කෑම නිසා මිය යෑමට හේතු වුනා. අද වන විට සුනඛයන් එන්නත් කරන කටයුතු සිදු වෙන්නේ නැහැ. මෙම සුනඛ එන්නත් කිරීමේ වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා ඔබතුමාව දැනුවත් කරන්න කියලා සුනඛ හිමියන් ඉල්ලීම් කරනවා. උඩුගම moh කාර්යාලය දැනුවත් කරලා, අවශ්‍ය කටයුතු කරන්න. මොකද අර දරුවට සිදුවුන වගේ සිදුවීමක් වුණාට පස්සේ, මේ දේ කරල වැඩක් නැහැ. මහජන සෞඛ්‍ය නිලධාරිතුමන්ට කිව්වම කියනවා. තවම අපට ගාල්ලෙන් ඒ සම්බන්ධව කටයුතු කරන්න කියලා නැහැ, ඒ නිසා අපිට මොනවත් කරන්න විදිහක් නැහැ කියලා.
ඌරල පුට්ටු පාලමේ ඇඳි ටික දිරලා යනවා. ඒක සවි කරලා දෙන්න සභාපතිතුමා. මොකද යම් අනතුරක් වෙන්න කලියෙන්.
ඒ වගේම ඌරල කොතේගොඩකන්ද ප්‍රදේශයට ජලය දෙන්න කටයුතු කළා. ඒ වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. පෙරේදා කිව්වා. ඊයේ වැඩ කටයුතු කලා. ඒ වගේම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි. ඌරල පොදු නාන ළිඳට මොකද වෙන්නෙ කියලා. වසර තුනහමාරකටත් අධිකයි. ඒත් තවම මොනවත් වෙලා නැහැ. මට උත්තරයක් දෙන්න. මේක කරන්න පුළුවන්ද? බැරිද? කියලා. දැඩි නියඟය නිසා මිනිසුන්ට දුෂ්කරතා ඇති වෙලා තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න කියමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඇත්තටම ඔය කුකුළන් දෙන වැඩසටහනේදී, මම දන්නෙ නිලධාරීන් ඇවිල්ලා ඒවා බෙදන අවස්ථාවේ දී. මෙම ගමේ මිනිස්සු කුකුළු කූඩුත් හදලා ඉවර වුනාම. ඇත්තටම ඒ ගැන ලැජ්ජ වෙන්න ඕන කාරණයක්. මොකද මම දන්නේ නැහැ. නමුත් අපට අරගල කරලා, මේ අය දාන්න ඕනි කියලා කියන්න තිබුණා. ඒත් ඒ කට්ටියට කුකුළු පැටියෙක් හරි දුන්නම ගමේ ඉන්න බැරි පිරිසකුත් හිටියා. නමුත් මම කවදාවත් එහෙම ජරා විදිහට දේශපාලනය කරන්නේ නැහැ. වනමල් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට ධර්මසිරි මන්ත්‍රීතුමා පිළිතුරු දුන්නා. අපේ කොට්ඨාස මන්ත්‍රීවරයා විදිහට මම ස්තුතිවන්ත වෙනවා. ධර්මසිරි මන්ත්‍රීතුමාට. ඒ උත්තර දීපු ආකාරය සම්බන්ධයෙන්. ඒ වගේම ලක්ෂ තිස් අටක කොන්ත්‍රාත් එකේදි, අවසන් මොහොතේ සල්ලි ඇවිල්ලා යන්න හැදුවේ. මුලින් කොන්ත්‍රාත් එක බාරගෙන එක්කෙනෙක් හිටියා. පස්සේ එයා බැහැ කිවුවා. ධර්මසිරි මන්ත්‍රීතුමත් එක්ක කතා කලාම, මල්ලි ඔයා කියනවා නම් කරන්නම් කිව්වා. හැබැයි මෙතුමාට ආවා චෝදනාත් එක්ක මෙතුමයි මමයි අමනාප වන තැනටම කටයුතු සිද්ධ වුණා. මේකෙ යම් යම් අර්බුද හැදුවා. එක පක්ෂයකට ගැති වෙච්ච පිරිසක් තමයි මේක කලේ. නමුත් බොහොම අමාරුවෙන් තමයි මේ දේ කරගෙන ගියේ. ඒ අදියරේ ලක්ෂ තිස් අටේ මුදලටම කරගන්න බැරි වුණා. මම හිතන්නේ ලක්ෂ 20 යි කලේ. අවසාන බිල් දාගන්න දිනට ප්‍රතිපාදන ලැබිච්ච ගානටම පාරේ කටයුතු සිදුකරගන්න බැරි වුනා. නැත්නම් අපට තව දුර යන්න තිබුණා. පොලිසිය හදන්න කියන කාරණාව එක්ක තමයි අපි පස් කපල ඉවත් කළේ. නැතුව අපි කොහේටවත් පස් දැම්මෙ නැහැ. මලාමුර පාසලට, තව අත්‍යවශ්‍ය යන්න බැරි ස්ථානවලට ධර්මසිරි මන්ත්‍රීතුමා පස් ගිහින් දැම්මා. ලැබෙන පොඩි මුදලෙන් හරි මෙතුමා ලොකු සේවාවක් කළා. මේ වෙලාවේ මගේ කොට්ඨාශයට ආපු සල්ලි නැවත යන්න නොදී, මිනිසුන්ගෙන් බැණුම් අහගෙන හරි, ලස්සන පාරක් නිර්මාණය කිරීම සම්බන්ධව, ධර්මසිරි මන්ත්‍රීතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

ගරු සභාපතිතුමනි, වචනයක් දෙකක් මේ සභාවේ කතා නොකලොත් හොඳ මදි නිසා කතා කරන්න හිතුනා. ඇත්තටම වනමල් මන්ත්‍රීතුමා 74 නිදහස් උත්සවය මතක් කලහම මටත් මතක් වුනා. නායක සහෝදරයාට කුණු බිත්තර ප්‍රහාරය එල්ල කිරීම සම්බන්ධව. අපි ඒ ප්‍රහාරය හෙළා දකිනවා. තරංග මන්ත්‍රිතුමා අදහස් ප්‍රකාශ කළ පරිදි, උඩුගම දකුණ ක්‍රීඩාංගනය බැකෝ එකක්ඇවිත් අවුස්සලා යනවා. ඔබතුමා විධිමත් පරිදි පැය ගානක් වෙන් කරලා තියෙනවද? මම දැක්ක දේ කිව්වේ. චන්ද්‍රසිරි මන්ත්‍රිතුමා, කොට්ඨාස බාර මන්ත්‍රිතුමා හරහා මේ කටයුත්ත බාර දෙන්න. තරග තියෙන ක්‍රීඩා පිටියක්. මේ විධිමත්භාවය නොමැතිකම නිසා තරග තියන්නත් අපහසු වුණා. code එක මෙහාට ගෙනැල්ලා නැවතත් නිවැරදි පැත්තට හදලා දෙන්න. නැත්නම් වැරදි මතයක් තමයි එන්නේ. අපි විරුද්ධ නැහැ. ඒක ලස්සනට හදල දෙන්න.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමා ඒකෙ දැලක් ගහලා තියෙන එකට අපේ කිසිම සම්බන්ධයක් නැහැ. ඔය සිද්ධිය සම්බන්ධව මම දැනුවත් නැහැ.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

වැරදි මතයක් සමාජගත වෙන්න දෙන්න එපා. උඩුගම දකුණ, උනන්විටිය, කුමන ක්‍රීඩා පිටියක් සංවර්ධනය කලත් කමක් නෑ ක්‍රීඩා පිටියක්නම් සංවර්ධනය කරන්න කියන්නෙ කොහේ කළත් කමක් නැහැ. ඒක පටලවන්නෙ නැතුව කලානම්,

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

මාපලගම සහ උඩුගම දකුණ ක්‍රීඩාපිටිය කියලා තිබුනෙ පස්සෙ උඩුගම දකුණ කැන්සල් කලේ ,

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

කෙසේ වෙතත් සභාපතිතුමනි, මේක නිවැරදි කරලා, ඒ තරුණයන්ටත් සෙල්ලම් කරන්න පුළුවන් විදිහට ලස්සනට හදල දෙන්න. පාර අයිනෙ ක්‍රීඩාපිටියක්, පෙර පාසලක් තියෙනවා. සුද්ද කරන්න කියන ඉල්ලීම තමයි මතක් කළේ.

ඒ වගේම ඔබතුමා මූලාසන කතාවෙන් කියන්න නියමිත ඇති නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති උත්සවයේදී වජිර අබේවර්ධන මහතා යම් අපහසුතාවයකට පත්වුණා නම්, අපගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. දේශපාලන අධිකාරියටත්, ප්‍රාදේශීය ලේකම්තුමාටත්, නිලධාරීන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. මෑත කාලයකදී ඉතාම ලස්සන වාම් උත්සවයක් දකින්න ලැබුණා. උත්සව සභාව ඉතාමත් කෙටියෙන් සංවිධානය කරලා තිබුණා. වජිර අබේවර්ධන මැතිතුමා ඒ කටයුත්තට මිලියන 94 ක මුදලක් වෙන් කළා. ප්‍රධාන ආරාධිත අමුත්තා අඩුවක් නැතුව, එතුමා ගැන සඳහන් කළා. ඒ සම්බන්ධව එතුමාට ස්තූතිවන්ත වෙනවා.

රටේ ආර්ථිකය සම්බන්ධයෙන්, රටේ කර්මාන්තශාලා වැහිලා. මම කතා කරන්නේ කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් නොවෙයි. නමුත් පොහොර අර්බුදය නිසා, ඒක සඳහන් නොකර, කර්මාන්තශාලා වැහීමට හේතු සඳහන් කරනවා නම්, ගනේවත්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කල කර්මාන්තශාලා වැඩිපුර තිබීම හේතු වෙන්නත් ඇති. ප්‍රධාන කාරණය තමයි දළු අස්වැන්න අඩු වී ආර්ථිකයට බලපාන තියෙනවද කියලා. ජයවීර මන්ත්‍රිතුමා කිව්ව වගේ,මන්ත්‍රීවරයකුට මළ ගෙදරක යන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා.ඊට විසඳුමක් ලෙස පොහොර 4000 හරි 4500 වැනි මුදලකට හරි ගෙනල්ලා දෙන්න. එවිට පොහොර කොට්ට එකක් දෙකක් දාලා හරි මේ තේ වගාව පාලනය කරගෙන යාවි. ආණ්ඩු මාරුව තමයි හොඳම විසඳුම කියලා හිතෙනවනම්, කොයි ආණ්ඩුව ගෙනාවත් මේඩොලර් අර්බුදයට නිශ්චිත විසඳුමක් නැත්නම්, රට අර්බුදයට යාම නිසැකයි. මම හිතන විදිහට පොහොර ගෙන ඒම නවත්වලා, රටට ඩොලර් ගෙන ඒමත් ඉබේම වැළකිලා තියෙන්නෙ. පරාක්‍රමබාහු රජතුමාගෙන් පස්සෙ සහල් අපනයන තත්ත්වයට පත් කරන්න රාජපක්ෂ ආණ්ඩුව සමත් වුණා .ඒ රාජපක්ෂවරුම මේ ප්‍රශ්නය නිසා, අනිත් රටවල්වලින් හාල් ආනයනය කරන්න තත්වයට රට පත් කරලා තියෙනවා.

අවුරුදු හතරක් ගෙවිලා බෝනස් අවුරුද්ද යන්නෙ. රාජපක්ෂ මන්ත්‍රීවරුන් යටතේ මේ වාසනාව ලැබුනා.

සම්බන්ධීකරණයෙ අඩුපාඩු තියෙනවා. ඒ කාලේ අපි සභාවෙන් ම නොවෙයි ආලෝකමත් වුනේ. ගම් වල තාක්ෂණික උපකරණ තිබුනෙ නැහැ. නමුත් අපි මැදිහත් වෙන නිසා අපේ නමින් ඒක යනවා.

ඉතිහාසය අන් කවරම කාලෙක වත් වඩා මුදල් ලැබුණු කාලෙ තමයි මේ. මොනම කාලයකවත් මෙහෙම මුදල් ලැබිලා නැහැ. කොට්ඨාසයට ලක්ෂ තිහයි. මන්ත්‍රීට ලක්ෂ හතළිහයි. සීමා මායිම් නැතිව ලැබෙනව මේ ප්‍රශ්න ඇතිකරගෙන තියෙන්නේ. සල්ලි ප්‍රශ්නයකට නෙවෙයි. සම්බන්ධීකරණ දුර්වලතා නිසා, හිනිදුම ආසන හා බද්දේගම ආසන සංවිධායකවරුන්ගෙන්, බද්දේගම ආසනය මැදිහත්වෙන්න අයිතියකුත් නැහැ. වෙනදා වගේ කොට්ඨාෂෙ සම්බන්ධීකරණ ගැටලුව ප්‍රශ්නයක් කරගෙන තියෙන්නෙ ඔබතුමාලා සාකච්ඡා කරලා විසඳගන්න සභාපතිතුමනි. හැබැයි මන්ත්‍රීවරුන්ටත්ඉ පමණ ඉක්මවා කේන්ති යන්නේ කොට්ඨාශවල තමන්ගේ ප්‍රශ්න විසඳගන්න බැරි වුනහම. හඟරන්වල පෙරපාසල වැහෙනවා නම් වැරදියි. අපි තීරණයක් ගත්ත. ඒක වලංගුයි. ගල්ලන්දල පෙර පාසල සම්බන්ධයෙන් ගත් තීරණය තමයි, ළමයි හත් දෙනෙක් පෙර පාසලේ හිටියා. මේක වහන්න ඕන කියලා කිව්වම, මේක දුෂ්කර පෙර පාසලක්. ඒනිසා වහන්න බැහැ. සභා අරමුදලින් පඩි ගෙවලා, පවත්වගෙන යන්න ඕනේ කියලා ඒක අපි ලාභ ගන්න

අවස්ථාවක් නෙවෙයි. පෙර පාසලක අවශ්‍යතාවය ඇති. නමුත් ඒ අදහස් ප්‍රකාශ කරන ආකාරය පාලනය කරගමු. අපි කවුරුත් පෘතග්ජන මිනිස්සු. ඒ වගේම අන් පෙර පාසල් වල තියෙන තත්ත්වය නෙවෙයි, මේ දුෂ්කර පෙර පාසල්වල තියෙන්නේ. අපි එක පෙරපාසලක් වත් වැහෙන්න දුන්නේ නැහැ. අද වගේ නෙවෙයි. ලොකු යුද්ධයක් තිබුණා. පඩි ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබුණා. මූල්‍ය අර්බුදයක් තිබුණා. මේක සාකච්ඡා කරලා විසඳගන්න පුළුවන් ප්‍රශ්නයක් මේක. සභාපතිතුමනි, කොට්ඨාශවල මිනිස්සු ආරක්ෂා කරන්න කටයුතු කරන්න. අපි එකට හිටියා. සමගිව කටයුතු කලා. සභාව හොඳින් ගෙනියන්න ශක්තිය, ධෛර්යය ඇති වේවායි ප්‍රාර්ථනා කරමින්, සභාව හැටියට යෝජනාවක් දාන්න. අනුපාතික ඡන්ද ක්‍රමයක් තියන්න කියලා. මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු උප සභාපති එම් කේ ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද මේ සභාවේ විවිධ අදහස් හා යෝජනා වාද විවාද කටයුතු වලට සවන් දුන්නා. අපේ මන්ත්‍රීවරු පිරිසක් නැහැ. කරන්න බැහැ. සෝමාලියාවක් වෙලා කියලා කියනකොට, වැටීමක් නොවේ. ජයග්‍රහණය කර යාමක්. විශ්වාසෙන් කටයුතු කරලා, අපි මේකෙන් ගොඩ එන බව සඳහන් කරමින්, කතා කළා. මේ පිළිබඳව විස්තර කරන්න අවශ්‍ය නැහැ. උගත් බුද්ධිමත් සභාවක් තියෙන්නෙ.

මුලින්ම මට අදාළ මාතෘකා දෙකක් පිළිබඳව කතා කරන්න යන්නේ. කාලයක් තිස්සේ ඇදගෙන ගිය ඩයලොග් කුලුනක් ඉදිකිරීම සම්බන්ධව යෝජනාව, කරන්න පුළුවන්. ජාතික අවශ්‍යතාවයක්. ඒක සභාවේ අනුමත වෙන්න ඕනේ නැහැ. කුළුණ ඉදි කරනවද? නැද්ද? කියන එක සම්බන්ධව රටේ අවශ්‍යතාවය, ජනතාවගේ අවශ්‍යතාවය, ඒ කුළුණ ඉදි කරන කෙනාගේ අවශ්‍යතාවය හෝ ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව වන දෙයක්. ඒක මට දැනගන්න ලැබුනේ වෙනත් සභාවල සභාපතිවරුන්ගෙන්. සන්නිවේදන කුළුණක් ඉදි කිරීම සඳහා යම් පරිත්‍යාග මුදලක් ඉල්ල ගන්න පුළුවන්. සමාජයේ පොදු කටයුතු සඳහා කාලයක් තිස්සේ, ඒ දේ කෙරිලා තියෙන නිසා. ඒ දේ කරගන්න පුලුවන්. මැදිහත්වීමක් තමයි මම බලාපොරොත්තු වුණේ. අද සභාවට සභාපතිතුමා ඒක ඉදිරිපත් කළා. අපේ ජයවීර මන්ත්‍රීතුමා එම යෝජනාව ස්ථිර කළා. ඔබතුමාලා දෙපළම මැදිහත් වෙලා අපේ ප්‍රදේශය සංවර්ධනය කරන්න කටයුතු කරනවා ඇතැයි මම විශ්වාස කරනවා. අඩු තරමෙ සිළිංඩර් ටිකක්වත් උඩලමත්ත ජනතාවට දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

උඩලමත්ත ස්වරණ බිම්බාරාමයේ මෙම මස එකොළොස් වැනිදා උදේ 8.00 සිට සවස 4.00 දක්වා අක්ෂි සායනයක් පැවැත්වෙනවා. ඔබතුමාලගේ ප්‍රදේශයේ ඇස් කණ්නාඩි ලබාගැනීමට, අවශ්‍ය ජනතාව දැනුවත් කර, එම දිනයට එන්න කියලා ආරාධනා කරනවා.

අජිත් මහත්තයා ඉදිරිපත් කලා. ඔබතුමාලට වූ ප්‍රශ්නය තමයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කරන අවස්ථාවේ දී, සිදු වූ සිද්ධිය සම්බන්ධව. ඇත්තටම ගිය ආණ්ඩුවෙන් හදපු දේවල්, මේ ආණ්ඩුවෙන් විවෘත කරනවා. මේ ආණ්ඩුව හදපු දේවල් ඊළඟ ආණ්ඩුව විවෘත කරනවා. ඒවා සාමාන්‍ය දේවල්. සියලු දෙනාට ආරාධනා කරන්න කියලා මමත් කිව්වා. ඒ වෙලාවේ ආසන පනවල තිබුණා. අපි කවුරුත් නොකිව්වට එම ස්ථානයට පැමිණි ප්‍රධාන ආරාධිත අමුත්තා, අතීතයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ කටයුතු කරපු මැතිතුමෙක්. එතුමා ලස්සන කතාවක් කලා. එතුමා දැනගෙන හිටිය නම් ඔය ඵලකය ගලවපු බව, එතුමා ඒ ගැනත් සඳහන් කරනවා. වජිර අබේවර්ධන මැතිතුමාට ස්තුති කළා. ඒ වගේම ගරුත්වයක් ලබා දුන්නා.

දීර්ඝ වශයෙන් කතා කළේ මන්ත්‍රීවරුන්ට තියෙන ප්‍රශ්න සම්බන්ධයෙන්, මල ගෙදරකට යන්න බැහැ. රටේ ප්‍රශ්න ගැන කතා කරනවා. උත්තර දෙන්න බැහැ කියලා. ලබන පෙබරවාරි වන විට ප්‍රාදේශීය සභා විසුරුවනවා. මැතිවරණයට මුහුණ දෙන්න වෙනවා. ජ්‍යේෂ්ට ද, නවක ද යන ප්‍රශ්නය නෙවෙයි. මහජන නියෝජිතයින් සංඛ්‍යාව පිළිබඳ ප්‍රශ්නයක් තියෙන්නේ. සභාවකට ඔරොත්තු නොදෙන මන්ත්‍රී සංඛ්‍යාවක් ඉන්නෙ. පරණ ක්‍රමයට මැතිවරණය තියෙනවා නම් හොඳයි.

පොහොර ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කතා කරනවානම්, සජිත් මහත්මයා රසායනික පොහොර, බෙහෙත් 100% ක් දෙනවා කියනවා. එතුමාගේ ඒ ක්‍රියා කලාපය ජනතා විමුක්ති පෙරමුණ අනුමත කරනවා. මගේ ප්‍රතිපත්තිය නම්, රසායනික ද, කාබනිකද යන එක නොවෙයි සමතුලිත භාවයෙන්

යුතුව පොහොර ප්‍රතිපත්තියක්‍රියාත්මක කල යුතුයි. රටින් හාල් ගේන එක ගැන කතා කරනවා. මෙරටේ අස්වැන්න අඩු වන විට වන්දි දෙන්න ප්‍රතිපත්ති සකස් කරලා තියෙනවා. හාල් මෝල් හිමියන් විසින් රජය අල්ලේ නටන තත්ත්වයට පත් කරගෙන තියෙනවා. ඒක නැති කරන්න, රටෙන් හාල් ගෙන්නලා සමතුලිත තත්වයකට පත් කරගෙන තියෙනවා. ඒක හොඳ දෙයක් ලෙස මා දකිනවා. අපි ඒවට වැටෙන්න ඕනේ නැහැ.
අජිත් මහත්මයා කිව්වා වසමකට ලක්ෂ තිහක්, ප්‍රාදේශීය මන්ත්‍රී කෙනෙකුට ලක්ෂ හතළිහක් දෙනවා කියලා. ඒ කටයුත්ත ආරම්භ කළා පමණයි. ඊළඟට මේ මුදල් වලට වාර්ෂික සැලසුම් සකස් කරල තියෙන්නෙ. 80% ක්ජීවනෝපාය සංවර්ධන ක්‍රමයකට තමයි යොදා ගත හැක්කේ. පාරවල් සඳහා ලක්ෂ දහයක් වැනි ප්‍රමාණයක් පමණයි යොදාගන්න පුළුවන්.ඒ සම්බන්ධව මට දැඩි විශ්වාසයක් තියෙනවා. එහෙමනම් මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මන්ත්‍රීවරුනි, අදට දවස් තුනකට කලින් තමයි 74 වන නිදහස අපි සැමරුවේ. අවුරුදු හැත්තෑ හතරක් ගියත්, නියම නිදහස අපි ලබා ගත්තේ මීට වසර දහතුනකට කලින් කියලා, මම විශ්වාස කරනවා. ඒ තමයි රුදුරු කොටි ත්‍රස්තවාදයෙන් රට මුදවා ගෙන, ජීවත්වීමේ නිදහස ලබාදීම. එයට මූලික වන චරිත දෙක තමයි, වර්තමානයේ ජනාධිපති ධූරය දරන අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ වර්තමාන අග්‍රාමාත්‍ය අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා යන දෙපල. නමුත් අපි මේ නිදහසින් නියම ප්‍රයෝජන ගන්නවද කියලා බරපතළ ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙනවා. තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, අයිතිය තිබූ පමණින්, නිදහස ලැබුණා කියලා සිටීම හොඳ නැහැ. කාලෙන් කාලෙට නිදහසට වෙනත් ආකාරයෙන් බලපෑම් එල්ල වෙනවා. උදාහරණ හැටියට වර්තමානයේ ඇති වී ඇති කොවිඩ් වසංගත තත්වය නිසා අපට අපගේ නිදහස ඇහිරුණා. නිදහසේ ඇවිදින්න බැහැ. රාජකාරියට යන්න බැහැ. මළ ගෙදරක, මගුල් ගෙදරක කටයුතු අපට අවශ්‍ය ආකාරයට කරන්න බැහැ. අවශ්‍යතාවය අනුව, ඒවාට නීති බාධක දමන්න සිදු වෙනවා. අපට වෙනදා මෙන් සභාව පැවැත්වීමටවත් නිදහස නැහැ. නමුත් මේ සියලු බාධක හමුවේ තමයි අපට ඉදිරියට යන්න වෙලා තියෙන්නෙ. අද වුණත් මෙම ගෞරවනීය සභාවේ යම් සිදුවීමක් වුණා නම්, ඒ කථනයේ නිදහස නිසා වූවක් බවයි මගේ හැඟීම. අපි අතීතය දිහා බලලා, වර්තමානයෙත් ඒ වගේ කියලා සිතුවොත් මම හිතන්නේ නැහැ එය සාධාරණයි කියලා. අද ධනංජය මන්ත්‍රීතුමාගේ හැසිරීම තුළ මම දකින්නේ අතීතය දිහා බලලා කළ කතාවක් ලෙසයි. මමත් මෙම සභාවට පත් වී ආවේ 2002 වර්ෂයේ. විපක්ෂ මන්ත්‍රී කෙනෙකු විදිහට. මේ වන විට නොකඩවා වසර විස්සකට ආසන්න කාලයක්. ඒ අතරතුර සභාපතිවරු තුන්දෙනෙක්ගේ ආභාෂය ලැබුවා. වර්තමාන මන්ත්‍රීවරුන් වන චන්ද්‍ර සහබන්දු මැතිතුමා, අජිත් එඩේරආරච්චි මැතිතුමා අභවප්‍රාප්ත හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා (ධනංජය මන්ත්‍රීතුමාගේ පියා), ආදීන් සමග, නමුත් අපි ගැටුම් ඇති කර ගත්තේ නැහැ. බල ප්‍රදේශ පිළිබඳව ගැටළු තිබුණෙ නැහැ. අරක කලේ නැහැ. මේක කළේ නැහැ කියලා රණ්ඩු වුණේ නැහැ. ඒ දිනවල අපිත් ඉල්ලීම් සියගානක් ඉදිරිපත් කළත්, ලැබූ දෙයක් නැහැ. සභාවේ ඉන්න පරණ මන්ත්‍රීවරු සාක්ෂි දරනවා. උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා, මේ පිළිබඳව හොඳටම දන්නවා. මොකද මෙතුමත් 1997 වර්ෂයේ සිට මන්ත්‍රිධුර දරන නිසා. ඒ අනුව අද දින සභාවේ ප්‍රකාශ වූ යම් දේවල් පිළිබඳ මගේ අමනාපයක් නැහැ. කළකිරීමක් පමණයි තියෙන්නෙ. මන්ද මට පුළුවන් ආකාරයෙන් සහ සභාවේ මූල්‍ය තත්ත්වයන් වගේම, සභාවේ නිලධාරීන්, සේවකයන්ගේ අඩුපාඩු සහිතව තමයි මම මෙම සභාව පවත්වාගෙන යන්නේ. ඔබතුමාලා මේ පිළිබඳව මනා වැටහීමක් තියෙන බවත්, මම දන්නවා. සමහර මන්ත්‍රීවරු දොස් නගන විට, සමහර මන්ත්‍රීවරු හොඳ කියනවා. අපේ රටේ මිනිස්සු නිතරම දකින්නේ හොඳ දේට වඩා නරක දේ. වර්තමානයේ තාක්ෂණ දියුණුවත් සමග විශේෂයෙන්ම facebook වැනි සමාජජාලා නිසා මෙය වඩාත් මිනිසුන් අතරට යනවා. හිටපු සභාපතිවරුන් මෙන්ම, මන්ත්‍රීවරුන් එක්

අතකින් වාසනාවන්තයි. ඒ අවධියේ මෙතරම් තාක්ෂණික දියුණුවක් තිබුණෙ නැහැ. දැන් බලන්න ඉදිවෙන ආදාහනාගාරය ගැන කතා වෙන්නේ නැහැ. එහි පාරේ ඇති ගල ගැන කතාවෙනවා. මම කියන්නේ නැහැ. ඒවා කතා නොකළ යුතුයි කියලා. අවුරුදු ගාණක් අළුත්වැඩියා නොකල වීදි පහනක්, අලුත් වැඩියා කර, එය පසුදා වන විට අක්‍රීය වුනොත්, එදා ඉඳලා මට අස්වැසිල්ලක් නැහැ. දුරකථනයෙන් නිතර නිතර දැනුම් දෙනවා. ඒ වගේම සිදුවීමක් තමයි අද දින සභබන්දු මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශ වුණේ. නාගොඩ අලුතින් ඉදිකළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංකීර්ණය පිළිබඳව, එහි මූලාරම්භය හිටපු ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා. එහි ගරුත්වය අඩුවක් නැතුව එතුමට ලැබෙනවා. විවෘත කිරීම කළේ ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා. නමුත් කවුරුන් හෝ facebook සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරළ තියෙනවා. මුල් ගල තැබූ දින ස්ථාපිත කළ ඵලකය අයින් කරලා කියලා. ඒ අනුව ආරාධනා කළ මුත්, වජිර ඇමතිතුමා සහභාගි වුණේ නැහැ. වැරදි වැටහීමක් ලැබුන නිසා. නමුත් එදින ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා හිටපු අමාත්‍යතුමා ගැන වර්ණනා මුඛයෙන් කතා කළා. එහි අඩුවක් කළේ නැහැ. පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් මෙන්ම සියලු විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. වැරදි වැටහීම් ඇති කර නොගන්නා ලෙස. අපේ මිනිස්සු බොර දියේ මාළු අල්ලන්න හරි දක්ෂයි.

ඒ වගේම මන්ත්‍රීතුමනි, 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය තිබූ දවසේ, නාගොඩ රාජකීය පාසලේ සිදුවුණු සිදුවීම් පිළිබඳව මා පෞද්ගලිකව සොයා බැලුවා, මා දැනගත් කරුණු අනුව, විභාගය අමාරු බැවින්, පොඩි ළමයි අසරණ වෙලා තමයි, තමන්ගේ දෙමව්පියන් සමග හැඟුම්බරව සිට ඇත්තේ. උත්තර පත්‍ර වෙලාවට කලින් ඉල්ලා ගත් බවත් දැනගැනීමට ලැබුණේ නැහැ. ඒ ළමුන්ට අසාධාරණයක් වූවානම්, ඒ පිළිබඳව ඉහළ නිලධාරීන් දැනුවත් කොට, අවශ්‍ය පියවර ගැනීමටත්, අපි පසුබට වෙන්නේ නැහැ.

ඒ වගේම ගරු මන්ත්රීවරුනි, උඩුගම දකුණ ක්‍රීඩාපිටිය පිළිබඳව සභාවේ ප්‍රකාශ වූ කරුණු පිළිබඳවත් කීමට ඇත්තේ මෙයයි. මම මේ පිළිබඳව මීට ඉහත සභාවලදිත්, ප්‍රකාශ කළා. ලක්ෂ 15 ක වොලිබෝල් ක්‍රීඩාපිටියක් තමයි එම ස්ථානයේ සෑදීමට ආරම්භ කළේ. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ක්‍රීඩා පිටියක් ලබාදෙන බැවින්, අපට ලැබුණු ක්‍රීඩාපිටිය උණන්විටියටත්, උඩුගම දකුණට ආ ක්‍රීඩා පිටිය යක්කලමුල්ලටත් වශයෙන් තමයි ලැබුණේ. ඉන් අනතුරුව තමයි, මාත් යෝජනාවක් හැටියට සභා අරමුදලෙන් ලක්ෂ 3 ½ ක් හා ගරු මන්ත්‍රී ඉසුරු දොඩන්ගොඩ මැතිතුමාගේ ලක්ෂ 3 ½ ක් වශයෙන් ලක්ෂ 7 ක මුදලක් යොදවා, වොලිබෝල් ක්‍රීඩා පිටිය හදන්න හැදුවේ. නමුත් ගමේ අයගේ ඉල්ලීම පිට ඉසුරු මන්ත්‍රීතුමාගේ ලක්ෂ 3 ½ ක මුදල ක්‍රීඩාගාරය හදන්න වෙන් කරන්න සිදු වුණා. මේ සියල්ල දෙසැම්බර් 31 දාට අවසන් විය යුතු නිසා, අවශ්‍ය දෛනික ලේඛන සහ ඇස්තමේන්තු සැකසීම් පමා වූ නිසා, එම මුදල් අවිච්ඡේද නොවන නිසා, එම කර්මාන්තය නතරවුණා. නමුත් සභාවෙන් ලබාදෙන රුපියල් ලක්ෂ3 ½ අපට ඒ සඳහා වියදම් කිරීමට කළ හැකි බව පවසන්න කැමතියි. මේ වන විට මෙම ක්‍රීඩා පිටිය රුපියල් 40000.00 ක මුදලක් වැයකොට සංවර්ධනය කරලා තියෙනවා.

ඒ වගේම හඟරන්වල පෙර පාසල වැසීයාමට හේතුව තමයි, ළමයි නොමැතිකම සහ එය පවත්වාගෙන ගිය පාලිකාව වෙනත් රැකියාවකට යෑම. ධනංජය මන්ත්‍රීතුමා, ඒ දිනවල යෝජනා කළ, පාලිකාවට අවශ්‍ය සුදුසුකම් තිබුනෙ නැහැ. ඒ අවට සුදුසුකම් ලත් ළමයෙකු සිටියත්, ඒ සඳහා මන්ත්‍රීතුමාගේ කැමැත්තක් නැති වීම නිසා තමයි හඟරන්වලට කිට්ටු, සුදුසුකම්ලත් පාලිකාවක් හැටියට බඳවා ගත්තේ. මීට කලින් සේවය කළ පාලිකාවට සභාවෙන් රුපියල් දහදාහක දීමනාවක් ගෙවූ නමුත්, අලුතින් පත් කළ පාලිකාවට එම දීමනාව ගෙවීම කල නොහැකිය. එහෙම ගෙවනවානම්, අපේ පෙර පාසල් වල තවත් එවැනි අය කිහිප දෙනෙක් ඉන්නවා. උදාහරණයක් හැටියට තල්ගස්වල පෙරපාසලේ පාලිකාව සේවය කරන්න ඇවිත් දැන් අවුරුදු 12කට වැඩියි. එතුමියත් ඉල්ලීම් කරලා තියෙනවා. දීමනාවක් ලබා දෙන්න කියලා. උක්ඹිවිට පෙර පාසලේ අවුරුදු

8ත් 10ත් වැනි දීර්ඝ කාලයක් වැඩ කරන සහය පාලිකාවන් ඉන්නවා. මේ සියලු දෙනා ඉල්ලීම් කරනවා. මේ වන විට මෙම පෙර පාසල් විෂය පථය මධ්‍යම රජය මගින්, වෙනම අමාත්‍යාංශයකට යටත් කොට තියෙන්නේ. ඒ අනුව ඉදිරියේදී පෙර පාසල් නියමනයක් ඇතිව පවත්වාගෙන යාමට සිදුවේවි.

ඒවගේම උප සභාපතිතුමා ප්‍රකාශ කළ, ඩයලොග් කුලුන ඉදිකිරීමට අවසර ඉල්ලා, මීට මාස කිහිපයකට පෙර ඉදිරිපත් කළ ඉල්ලීම් ලිපිය, මම සභාව වෙත යොමු කළේ, සියලු දෙනාගේ දැන ගැනීම පිණිස සහ සභාවට යම් ආදායමක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකසා ගෙන යෝජනාවක් ගෙන ඒමට නමුත්, අපට එවැනි දෙයක් කිරීමට හැකියාවක් නොමැති නිසා වෙන්, ඉදිරිපත් කොට ඇති ඉල්ලීම සියලුම අනුමැතියන් ලබාගෙන තිබෙන නිසා, අවශ්‍ය සභාවේ අනුමැතිය ලබාදීමට කටයුතු කරනවා.

වෙනත් කරුණු යටතේ, මීට වඩා යමක් ප්‍රකාශ කිරීම නතර කරමින්, අද දින සභාවට පැමිණි සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ස්තුතිය පුද කරමින්, සභාව පවත්වාගෙන යන අතර වාරයේ, මන්ත්‍රීවරයකු හෝ මන්ත්‍රීවරියකගේ සිත් රිදීමක් වුණා නම්, ඒ පිළිබඳව වැඩිය නොතකන ලෙසත්, අද දින යෝජනා කරගත් පරිදි, මන්ත්‍රීවරුන්ගේ සුහද චාරිකාව ලබන මස දිනයක දී යෑමට, සංවිධානය කිරීමට සුභාෂි මන්ත්‍රීතුමියට පවරමින්, සභාවේ වැඩකටයුතු මෙතකින් නිමා කරනවා. ඔබ සැමට සම්මා සම්බුදු සරණයි.

2022.02.08 දින පවත්වන ලද සභා වාරයේ රැස්වීම් වාර්තාවේ විරෝධතා නිවැරදිකිරීම් වලට යටත්ව සම්මත කරන ලද බව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:-